10 ශ්‍රේණිය සිංහල සාහිත්‍යය

විචාර ධාරා

සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

10 ශ්‍රේණිය සිංහල සාහිත්‍ය ඒකක 7ට අදාල විචාර 23ක් අන්තර්ගත කර ඇත.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

01. මහෞෂධ පණ්ඩිතයන්ගේ උපාය කෞශල්‍යය හේතුවෙන් වේදේහ රාජ්‍යය ආරක්ෂා වූ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

හෙළ බොදු බැතිමතුන්ගේ අතිශය ජනාදරයට පත් පන්සිය පනස් ජාතක පොතෙහි එන දීර්ඝතම ජාතකය උම්මග්ග ජාතකයයි. ස්ථිර කතුවරයෙකු නොමැති වුවත් කතුවරුන් කිහිප දෙනෙකුගේම දායකත්වයෙන් ලියැවුනු බව පිලිගැනෙන ජාතක පොත් වහන්සේ හතරවන පරාක්‍රමබාහු රජ දවස වීරසිංහ ප්‍රතිරාජ ඇමතිවරයාගේ අනුග්‍රහයෙන් පාලි ජාතකට්ඨ කතාව ඇසුරෙන් සකස් වූවකි. අපණ්ණක ජාතකයෙන් පටන් ගෙන වෙස්සන්තර ජාතකයෙන් අවසන් වන මෙහි අන්තර්ගත මා හැඟි ජාතක කතා ගණන 547 කි.

උත්තර පඤ්චාල නුවර චූලනී බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කෙරෙති. ඒ රජ්ජුරුවනට කේවට්ට නම් බමුණු කෙනෙක් අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරයි. එකල මියුලු නුවර වේදේහ රජුගේ අනුශාසකයා වූයේ මහෞෂධ පණ්ඩිතයෝ ය. කේවට්ටයාගේ රහස් මන්ත්‍රණය මහෞෂධ පඬිතුමාට දැන ගත හැකි වන්නේ ඔහු විසින් චර පුරුෂ සේවාවේ යොදවා තිබුණු ගිරා පෝතකයා අතිනි.

සාල්ලෙක ලාලා පාතට බාන කෙනකුන් මෙන් කේවට්ට බමුණා හිසැ වර්චස් පිඩක් හෙළා, කිමෙක් දැයි කට දල්වා ගෙන උඩ බැලූ තැනැත්තවුන්ගේ මුඛයේ නැවැත වර්චස් පිඩක් හෙළා,

ගිරා පෝතකයා රහස් මන්ත්‍රණය අසා සිට කේවට්ටයා හිස වර්චස් පිඩක් හෙලා පලා යන ආකාරය කතුවරයා ඉදිරිපත් කරන්නේ පාඨකයාට හාස්‍ය රසයක්ද එක් කරමිනි. මෙලෙස මහෞෂධ පඬිතුමාගේ නුවණ නිසා ගිරා පෝතකයෙකු චර පුරුෂ සේවාවේ යොදවා ගැනීමෙන් මියුලු නුවරට අත්විඳින්නට සිදු වන අනතුර කල් තියා දැන ගන්නට අවස්ථාව උදා වෙයි.

උපායශීලි උපක්‍රම වලින් සියලු නුවර අල්ලා ගන්නා කේවට්ටයා ඇතුළු එක් සියයක් රජ දරුවන් අටළොස් අක්ෂෞහණියක් සේනාවෙන් යුක්ත ව මියුලු නුවර වට කොට සිටින වේලේ වේදේහ රජු ඇතුළු මියුලු නුවර වැසියන් බියෙන් තැති ගනියි. එවේලේ රජ්ජුරුවන් අස්වසාලීමට මහෞෂධ පඬිතුමා ක්‍රියා කරන ආකාරය පැසසුම් සහගතය. කතුවරයා එය උපමා වලින් ගෙන හැර දක්වන්නේ මෙසේය.

රෝගයෙන් පෙළෙන එකක් හට අවස්ථා පිළියමක් දන්නා වෙදකු පිළිසරණ වන්නා සේ ද, සා දුකින් පෙළෙන එකකුට භෝජනය මුත් අනෙකක් පිළිසරණ නොවන්නා සේ ද, පිපාසා ඇති එකකුට පැන් පුව හොත් මුත් ඒ පිපාසය නොසන්සිඳෙන්නා සේ ද, …

තම උපාය කෞශල්‍යය පිළිබඳව දන්නා රජු මෙන්ම නුවර වැසියන් මානසික පීඩාවෙන් මුදවාගැනීමට මහෞෂධ පඬිතුමා පළමුව ක්‍රියා කරයි. නුවර වැසියන් ලවා මහත් උත්සවයක් සූදානම් කරවන ඔහු මියුලු නුවර ආරක්ෂා කිරීමේ වගකීම තම භාරයට ගනියි. කේවට්ටයා නොයෙකුත් උපාය යොදවා මියුලු නුවර අල්ලා ගැනීමට උත්සහ කළත් ඒ සියලු උපාය මහෞෂධ පඬිතුමාගේ නුවණ හමුවේ ව්‍යර්ත වී යයි.

කීප දවසක් පැන් නවතා ලන්නා පැන් නොලදින් ක්ලාන්ත වූවාහු දොර ඇර පියන්නාහ. වී සාල් වැද්ද නො දෙම්හ. බතින් පීඩිත වූ මනුෂ්‍යයෝ දොර හැර පියන්නාහ. දර නවතා ලා නුවර ඇර ගනුම්හ යි කීයේ ය.

පැන් නැවැත්වූ කළ මහත් වූ පැන් ප්‍රමාණයක් නුවර ඇති බව පෙන්වයි. සාල් නැවැත්වූ කළ මහත් වූ සාල් ප්‍රමාණයක් නුවර ඇති බව පෙන්වයි. දර නැවැත්වූ කළ මහත් වූ දර ප්‍රමාණයක් නුවර ඇති බව පෙන්වයි. මෙලෙස මහෞෂධ පණ්ඩිතයන්ගේ උපාය කෞශල්‍යය හේතුවෙන් වේදේහ රාජ්‍යය ආරක්ෂා වූ ආකාරය ජාතකය පුරාම නිරූපණය වී ඇත්තේය.

හසිත හෙට්ටිආරච්චි
071-9020298

02. හාස්‍යයෙන් හා උපහාසයෙන් යුක්ත ව කේවට්ට බමුණාගේ චරිතය නිර්මාණය කර ඇති අන්දම පාඩම ඇසුරෙන් විමසන්න. (ලකුණු 10)

හෙළ බොදු බැතිමතුන්ගේ අතිශය ජනාදරයට පත් පන්සිය පනස් ජාතක පොතෙහි එන දීර්ඝතම ජාතකය උම්මග්ග ජාතකයයි. ස්ථිර කතුවරයෙකු නොමැති වුවත් කතුවරුන් කිහිප දෙනෙකුගේම දායකත්වයෙන් ලියැවුනු බව පිලිගැනෙන ජාතක පොත් වහන්සේ හතරවන පරාක්‍රමබාහු රජ දවස වීරසිංහ ප්‍රතිරාජ ඇමතිවරයාගේ අනුග්‍රහයෙන් පාලි ජාතකට්ඨ කතාව ඇසුරෙන් සකස් වූවකි. අපණ්ණක ජාතකයෙන් පටන් ගෙන වෙස්සන්තර ජාතකයෙන් අවසන් වන මෙහි අන්තර්ගත මා හැඟි ජාතක කතා ගණන 547 කි.

උත්තර පඤ්චාල නුවර චූලනී බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කෙරෙති. ඒ රජ්ජුරුවනට කේවට්ට නම් බමුණු කෙනෙක් අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරයි. ඔහුගේ අවිචාරවත් බුද්ධිය උපහාසයෙන් ගෙන හැර පාන කතුවරයා මෙසේ පවසයි.

තුමූ අලුයම් වේලෙහි පිබිද, සුවඳ තෙලෙහි නඟන ලද පහන් ආලෝකයෙන් ගන්ධදාම පුෂ්පදාමාවලම්බිත නා නා වර්ණ විචිත්‍ර විතානෝපලක්ෂිත අලංකෘත ශ්‍රී යහන් ගර්භය බලන්නාහ...

උදෑසන අවදි වී තම සිරි යහන් ගැබෙහි සුන්දරත්වය දැක, සියලු දඹදිවට චූලනී රජු අග රජ වන්නේ නම් තමන්ට මහත් වූ ලාබ ප්‍රයෝජන ඇති බව සිතන බමුණා ඒ සඳහා උපාය මාර්ගයක් රජුට රහසේ පවසයි. එනම් සේනාව රැස් කොට ගෙන පළමු කොට කුඩා නුවරක් වට කොට අල්ලා ගෙන උන්ගේ සේනාවත් හැර ගෙන අනෙක් නුවරකට ගොස් ඒ නුවරත් එසේ ම යටත් කොට ගෙන, මේ ලෙස සියලු දඹදිව රාජ්‍යය අල්ලා ගත හැකි බවයි. එහෙත් කේවට්ටයාගේ රහස් මන්ත්‍රණය මියුලු නුවර මහෞෂධ පඬිතුමා විසින් චර පුරුෂ සේවාවේ යොදවා තිබුණු ගිරා පෝතකයා අසා සිටියි.

සාල්ලෙක ලාලා පාතට බාන කෙනකුන් මෙන් කේවට්ට බමුණා හිසෑ වර්චස් පිඩක් හෙළා, කිමෙක් දැයි කට දල්වා ගෙන උඩ බැලූ තැනැත්තවුන්ගේ මුඛයේ නැවැත වර්චස් පිඩක් හෙළා, ...

ගිරා පෝතකයා රහස් මන්ත්‍රණය අසා සිට මල්ලක දමා පහතට හෙළන ආකාරයට කේවට්ටයා හිස වර්චස් පිඩක් හෙලා ඒ කුමක්දැයි කට ඇරගෙන උඩ බැලූ කළ නැවත මුඛයේ වර්චස් පිඩක් හෙලා පලා යන ආකාරය කතුවරයා ඉදිරිපත් කරන්නේ පාඨකයාට හාස්‍ය රසයක්ද එක් කරමිනි. මෙලෙස කේවට්ට බමුණාගේ චරිතය ජාතක කතාව ආරම්භයේදීම හාස්‍යයෙන් යුක්ත ව නිර්මාණය කිරීමට කතුවරයා සමත් වෙයි.

කේවට්ටයා චූලනී රජු සමඟ එක්ව කෙසේ හෝ තම උපායෙන් සියලු නුවර අල්ලාගෙන අවසානයේ එක් සියයක් රජ දරුවන් හා සමඟ අටළොස් අක්ෂෞහණියක් සේනාවෙන් යුක්ත ව මියුලු නුවර වට කොට ගනියි. එහිදී නුවරට ඇතුළු වීමට නොහැකිව නොයෙකුත් උපාය යොදවා මියුලු නුවර අල්ලා ගැනීමට උත්සහ කළත් ඒ සියලු උපාය මහෞෂධ පඬිතුමාගේ නුවණ හමුවේ ව්‍යර්ත වී යයි.

කීප දවසක් පැන් නවතා ලන්නා පැන් නොලදින් ක්ලාන්ත වූවාහු දොර ඇර පියන්නාහ. වී සාල් වැද්ද නො දෙම්හ. බතින් පීඩිත වූ මනුෂ්‍යයෝ දොර හැර පියන්නාහ. දර නවතා ලා නුවර ඇර ගනුම්හ යි කීයේ ය.

අවසානයේ ධර්ම යුද්ධයෙන්ද පරාජයට පත් වන කේවට්ටයා අසු නැඟී, කටින් ලේ දම-දමා නළලේ ලේ පිස-පිස දිවන්නේය. ගොවියා පුතු නොවැන්දෙමි. යි කියමින් පලා යන සේනාවෝ නතර කිරීමට උත්සහ ගත් කළ ඔව්හු ද **අධර්මිෂ්ඨ වූ නිකෘෂ්ට අනාචාර ස්වරූප ඇති අවලක්ෂණ වූ අඥාන බමුණු මහල්ල** ආදී නොයෙකුත් දේ කියමින් බමුණාට අපහාස කරති. මෙලෙස හාස්‍යයෙන් හා උපහාසයෙන් යුක්ත ව කේවට්ට බමුණාගේ චරිතය නිර්මාණය කර ඇති අන්දම ජාතකය පුරාම අඩු වැඩි වශයෙන් දැක ගත හැකි ය.

හසිත හෙට්ටිආරච්චි
071-9020298

03. උම්මග්ග ජාතක කථාවෙහි සාර්ථකත්වයට එක් හේතුවක් වී ඇත්තේ එහි යොදා ගත් භාෂා රීතිය සහ උපමා භාවිතය ආදියයි. නියමිත කොටස ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

හෙළ බොදු බැතිමතුන්ගේ අතිශය ජනාදරයට පත් පන්සිය පනස් ජාතක පොතෙහි එන දීර්ඝතම ජාතකය උම්මග්ග ජාතකයයි. ස්ථිර කතුවරයෙකු නොමැති වුවත් කතුවරුන් කිහිප දෙනෙකුගේම දායකත්වයෙන් ලියැවුනු බව පිලිගැනෙන ජාතක පොත් වහන්සේ හතරවන පරාක්‍රමබාහු රජ දවස වීරසිංහ ප්‍රතිරාජ ඇමතිවරයාගේ අනුග්‍රහයෙන් පාලි ජාතකට්ඨ කතාව ඇසුරෙන් සකස් වූවකි. අපණ්ණක ජාතකයෙන් පටන් ගෙන වෙස්සන්තර ජාතකයෙන් අවසන් වන මෙහි අන්තර්ගත මා හැගි ජාතක කතා ගණන 547 කි.

ජාතක පොතෙහි රීතියට අඩු වැඩි වශයෙන් සමානව රචනා වූ උම්මග්ග ජාතකයේ භාෂා රීතිය ඉතා අපූරුය. ඇතැම් පුවත් විවරණයේදී පාලි සංස්කෘත මිශ්‍ර රීතියක් අනුගමනය කරන කතුවරයා ඉතා දීර්ඝ යැයි සිතුනත් පාඨකයා ඇද බැඳ තබා ගන්නා අයුරින් එම විස්තරය ඉදිරිපත් කරයි. කේවට්ටයා උදෑසන අවදි වී දකින සිරි යහන් ගැබෙහි දර්ශනය කතුවරයා ඉදිරිපත් කරන අයුරු ඊට මනා නිදසුනකි.

> **තුමූ අලුයම් වේලෙහි පිබිද, සුවඳ තෙලෙහි නගන ලද පහන් ආලෝකයෙන් ගන්ධදාම පුෂ්පදාමාවලම්බිත නා නා වර්ණ විචිත්‍ර විතානෝපලක්ෂිත අලංකෘත ශ්‍රී යහන් ගර්භය බලන්නාහ, ...**

පූර්වෝක්ත නිදසුනෙන් පැහැදිලි වන්නේ මිශ්‍ර සිංහල භාෂා ශෛලයෙන් ජාතක කතා සංග්‍රහයේ බණ කතා රීතිය ගුරු කොටගෙන උමංදාව රචනා වූ බවකි. අවශ්‍ය තැන් වලදී කෙටි වැකි, දිගු වැකි, උපමා, අනුප්‍රාසවත් බස් වහර යොදා ගන්නා කතුවරයා ඇතැම් අවස්ථාවක සරල සිංහල රීතිය ඉස්මතු කරයි.

> **ඉතා අලජ්ජී වූ දුෂ්ට වූ කේවට්ටයා අසු නැගී, කටින් ලේ දම-දමා නළලේ ලේ පිස-පිස දිවන්නේ ය. සේනාවට ආසන්න ව අසු පිට ම හිඳ, vපින්වත්නි, නො යවග මම ගොවියා පුතු නොවැන්දෙමි. සිටුව, සිටුවv යි කී ය ....**

ධර්ම යුද්ධය පරාජයට පත් වන කේවට්ට බමුණා පලා යන ආකාරය උපහාසාත්මකව නිරූපණය කිරීමට කතුවරයා යොදා ගන්නේ සරල සිංහල භාෂා රීතියයි. දම දමා, පිස පිස ආදී ලෙස අනුප්‍රාසයද යොදා ගනිමින් එම අවස්ථාව සජීවීව නිරූපණය කිරීමට කතුවරයා සමත් වෙයි.

උම්මග්ග ජාතකය සාර්ථක වන්නේ එහි යොදා ගන්නා අතිෂය යෝග්‍ය උපමා නිසාවෙනි. සතර කන් මන්ත්‍රණය අසා සිටිනා ගිරා පෝතකයා කේවට්ටයා හිස වර්චස් පිඩෂක් හෙලා උඩ බැලූ කළ නැවත කටට වර්චස් පිඩෂක් හෙළීම මල්ලක දමා පහළට බානවා මෙන් යනුවෙන් කතුවරයා දක්වන්නේ මා හැගි උපමාවකිනි.

> **සාල්ලෙක ලාලා පාතට බාන කෙනකුන් මෙන් කේවට්ට බමුණා හිසෑ වර්චස් පිඩක් හෙළා, කිමෙක් දැයි කට දල්වා ගෙන උඩ බැලූ තැනැත්තවුන්ගේ මුඛයේ නැවැත වර්චස් පිඩක් හෙළා,**

මෙලෙස පාඨකයාට හාස්‍යක් ද ජනිත වන ආකාරයෙන් කතාව හසුරුවන කතුවරයා ඇතැම් අවස්ථාවක උපමා කිහිපයක් එකවිට යොදනු දක්නට ලැබේ.

> **රෝගයෙන් පෙළෙන එකක් හට අවස්ථා පිළියමක් දන්නා වෙදකු පිළිසරණ වන්නා සේ ද, සා දුකින් පෙළෙන එකකුට භෝජනය මුත් අනෙකක් පිළිසරණ නොවන්නා සේ ද, පිපාසා ඇති එකකුට පැන් පුව හොත් මුත් ඒ පිපාසය නොසන්සිඳෙන්නා සේ ද, ...**

ආදී ලෙස මහෞෂධ පඬිතුමා වේදේහ රජුට පිළිසරණ වූ අවස්ථාව අවස්ථාවෝචිත උපමා කිහිපයකින් ඉදිරිපත් කිරීම ඊට නිදසුනකි.

මෙලෙස කිසියම් සංසිද්ධියක් චිත්තරූප ජනනය වන අයුරින් ඉදිරිපත් කිරීමට භාෂා රීතියත් සුදුසු උපමා භාවිතයත් උමන්දාව පුරාවට දක්නට ලැබේ.

හසිත හෙට්ටිආරච්චි
071-9020298

04. මහෞෂධ පණ්ඩිතයාගේත් කේවට්ට බමුණාගේත් චරිත තුළ ඇති සම විෂමතා දක්වන්න.
(ලකුණු 10)

හෙළ බොදු බැතිමතුන්ගේ අතිශය ජනාදරයට පත් පන්සිය පනස් ජාතක පොතෙහි එන දීර්ඝතම ජාතකය උම්මග්ග ජාතකයයි. ස්ථිර කතුවරයෙකු නොමැති වුවත් කතුවරුන් කිහිප දෙනෙකුගේම දායකත්වයෙන් ලියැවුනු බව පිලිගැනෙන ජාතක පොත් වහන්සේ හතරවන පරාක්‍රමබාහු රජ දවස වීරසිංහ ප්‍රතිරාජ ඇමතිවරයාගේ අනුග්‍රහයෙන් පාලි ජාතකට්ඨ කතාව ඇසුරෙන් සකස් වූවකි. අපණ්ණක ජාතකයෙන් පටන් ගෙන වෙස්සන්තර ජාතකයෙන් අවසන් වන මෙහි අන්තර්ගත මා හැඟි ජාතක කතා ගණන 547 කි.

උත්තර පඤ්චාල නුවර චූලනී බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කෙරෙති. ඒ රජ්ජුරුවනට කේවට්ට නම් බමුණු කෙනෙක් අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරයි. එකල මියුලු නුවර වෛදේහ රජුගේ අනුශාසකයා වූයේ මහෞෂධ පණ්ඩිතයෝ ය. කතාව ආරම්භයේදීම කතුවරයා කේවට්ට බමුණා උදෑසන අවදි වී දකින සිරි යහන් ගැබෙහි දර්ශනය විස්තර කරයි.

තුමූ අලුයම් වේලෙහි පිබිද, සුවඳ තෙලෙහි නඟන ලද පහන් ආලෝකයෙන් ගන්ධදාම පුෂ්පදාමාවලම්බිත නා නා වර්ණ විචිත්‍ර විතානෝපලක්ෂිත අලංකෘත ශ්‍රී යහන් ගර්භය බලන්නාහ, ...

එයින් උද්දාමයට පත් වන බමුණා තම රජු සියලු දඹදිව අග රජ කිරීමට සිතිවිලි පහළ කරයි. කේවට්ට බමුණාගේ චරිතය චූලනී බ්‍රහ්මදත්ත රජතුමාට තිබූ පක්ෂපාතීත්වය ඉන් නිරූපණය වේ. එලෙසම මහෞෂධ පඬිතුමා වෛදේහ රජතුමාට තිබූ පක්ෂපාතීත්වය ද කතුවරයා වරින් වර නිරූපණය කරයි. කේවට්ට ඇතුලු පිරිස මියුලු නුවර වටකොට ගත් අවස්ථාවේ මහෞෂධ පඬිතුමා වෛදේහ රජුට පිලිසරණ වූ අවස්ථාව උපමා කිහිපයකින් ඉදිරිපත් කිරීම ඊට නිදසුනකි.

රෝගයෙන් පෙළෙන එකක් හට අවස්ථා පිලියමක් දන්නා වෙදකු පිලිසරණ වන්නා සේ ද, සා දුකින් පෙළෙන එකකුට භෝජනය මුත් අනෙකක් පිළිසරණ නොවන්නා සේ ද, පිපාසා ඇති එකකුට පැන් පුව හොත් මුත් ඒ පිපාසය නොසන්සිඳෙන්නා සේ ද, ...

පූර්වෝක්ත නිදසුනෙන් පැහැදිලි වන්නේ කේවට්ට බමුණාගේත් මහෞෂධ පඬිතුමාගේත් සම චරිත ලක්ෂණ තිබුණු බවකි. එහෙත් කේවට්ට චරිතය උපහාසාත්මක චරිතයක් ලෙස අපහාසයට ලක් කිරීම වරින් වර දක්නට ලැබේ. මහෞෂධ පඬිතුමාගේ නුවණ හමුවේ ධර්ම යුද්ධය පරාජයට පත් වන කේවට්ට බමුණා පලා යන ආකාරය ඉතා උපහාසාත්මකව නිරූපණය කිරීම ඊට කදිම නිදසුනකි.

ඉතා අලජ්ජී වූ දුෂ්ට වූ කේවට්ටයා අසු නැඟී, කටින් ලේ දම-දමා නළලේ ලේ පිස-පිස දිවන්නේ ය. සේනාවට ආසන්න ව අසු පිට ම හිඳ, "පින්වත්නි, නො යවග මම ගොවියා පුතු නොවැන්දෙමි. සිටුව, සිටුව" යි කී ය ....

සතර කන් මන්ත්‍රණය අසා සිටිනා මහෞෂධ පඬිතුමාගේ ගිරා පෝතකයා කේවට්ටයා හිස වර්චස් පිඩක් හෙලා උඩ බැලූ කළ නැවත කටට වර්චස් පිඩක් හෙළීම මල්ලක දමා පහළට බානවා මෙන් යනුවෙන් කතුවරයා දක්වන්නේ මා හැඟි උපමාවකිනි. එයින්ද මහෞෂධ පඬිතුමාගේ ප්‍රඥාව ඉදිරියේ කේවට්ට චරිතය බයාදු චරිතයක් ලෙසත් හාස්‍යට ලක් වීමත් දැක ගත හැකිය.

සාල්ලෙක ලාලා පාතට බාන කෙනකුන් මෙන් කේවට්ට බමුණා හිසෑ වර්චස් පිඩක් හෙළා, කිමෙක් දැයි කට දල්වා ගෙන උඩ බැලූ තැනැත්තවුන්ගේ මුඛයේ නැවැත වර්චස් පිඩක් හෙළා,

මෙලෙස මහෞෂධ පණ්ඩිතයාගේත් කේවට්ට බමුණාගේත් චරිත තුළ ඇති සම විෂමතා උමන්දාව පුරා වරින් වර දක්නට ලැබේ.

හසිත හෙට්ටිආරච්චි
071-9020298

05. වචන විනාශකාරී ලෙස භාවිතයෙන් සමාජයකට විය හැකි හානි පාඩම ඇසුරෙන් විමසන්න. (ලකුණු 10)

හෙළ බොදු බැතිමතුන්ගේ අතිශය ජනාදරයට පත් පන්සිය පනස් ජාතක පොතෙහි එන දීර්ඝතම ජාතකය උම්මග්ග ජාතකයයි. ස්ථිර කතුවරයෙකු නොමැති වුවත් කතුවරුන් කිහිප දෙනෙකුගේම දායකත්වයෙන් ලියැවුනු බව පිලිගැනෙන ජාතක පොත් වහන්සේ හතරවන පරාක්‍රමබාහු රජ දවස වීරසිංහ ප්‍රතිරාජ ඇමතිවරයාගේ අනුග්‍රහයෙන් පාලි ජාතකට්ඨ කතාව ඇසුරෙන් සකස් වූවකි. අපණ්ණක ජාතකයෙන් පටන් ගෙන වෙස්සන්තර ජාතකයෙන් අවසන් වන මෙහි අන්තර්ගත මා හැඟි ජාතක කතා ගණන 547 කි.

උත්තර පඤ්චාල නුවර චූලනී බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කෙරෙති. ඒ රජ්ජුරුවනට කේවට්ට නම් බමුණු කෙනෙක් අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරයි. ඔහුගේ අවිචාරවත් බුද්ධිය උපහාසයෙන් ගෙන හැර පාන කතුවරයා මෙසේ පවසයි.

> **තුමූ අලුයම් වේලෙහි පිබිද, සුවඳ තෙලෙහි නගන ලද පහන් ආලෝකයෙන් ගන්ධදාම පුෂ්පදාමාවලම්බිත නා නා වර්ණ විචිත්‍ර විතානෝපලක්ෂිත අලංකෘත ශ්‍රී යහන් ගර්භය බලන්නාහ...**

උදෑසන අවදි වී තම සිරි යහන් ගැබෙහි සුන්දරත්වය දැක, සියලු දඹදිවට චූලනී රජු අග රජ වන්නේ නම් තමන්ට මහත් වූ ලාබ ප්‍රයෝජන ඇති බව සිතන බමුණා ඒ සඳහා උපාය මාර්ගයක් රජුට රහසේ පවසයි. එනම් සේනාව රැස් කොට ගෙන පළමු කොට කුඩා නුවරක් වට කොට අල්ලා ගෙන උන්ගේ සේනාවත් හැර ගෙන අනෙක් නුවරකට ගොස් ඒ නුවරත් එසේ ම යටත් කොට ගෙන, මේ ලෙස සියලු දඹදිව රාජ්‍යය අල්ලා ගත හැකි බවයි. කේවිට්ටයාගේ මෙම වචන නිසා සමස්ත සමාජයටම බලපෑම් ඇති වේ. සියලු කටයුතු තිබියදී කේවිට්ටයාගේ මෙම වචන නිසා තෘෂ්ණාව ඇති කර ගන්නා රජතුමා රහස් මන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමට එකහෙලා සූදානම් වෙයි.

එහෙත් කේවට්ටයාගේ රහස් මන්ත්‍රණය මියුලු නුවර මහෞෂධ පඬිතුමා විසින් චර පුරුෂ සේවාවේ යොදවා තිබුණු ගිරා පෝතකයා අසා සිටියි. හෙතෙම කේවට්ටයා හිස වර්චස් පිඩක් හෙලා පළා ගොස් අදාල පුවත මහෞෂධ පඬිතුමාට දන්වයි. එහෙයින් නුවර ආරක්ෂා කර ගැනීමට හෙතෙම කටයුතු කරයි. එහෙත් කේවට්ටයාගේ විවිධ අදහස් නිසා යුද්ධයට යන සේනාවෝ නොයෙකුත් පීඩාවන්ට ලක් වෙති. ප්‍රාකාරය උඩ සිට හෙළන දැව කොටන් ආදියෙන් අනතුරට පත් වෙති. අහාරනොමැතිව පීඩා විඳිති.

> **කීප දවසක් පැන් නවතා ලන්නා පැන් නොලදින් ක්ලාන්ත වූවාහු දොර ඇර පියන්නාහ. වී සාල් වැද්ද නො දෙම්හ. බතින් පීඩිත වූ මනුෂ්‍යයෝ දොර හැර පියන්නාහ. දර නවතා ලා නුවර ඇර ගනුම්හ යි කීයේ ය.**

අවසානයේ ධර්ම යුද්ධය පරාජයට පත් වන කේවට්ටයා එයින්ද නොනැවතී පලා යන සේනාවන්ට නතර වීමට පවසයි. වචන භාවිතයේදී ඉන් සිදු වන අනර්ථය පිළිබඳ දැනුමක් ඔහු තුළ නොතිබුණා සේය. ඔහුගේ බසට රැවටෙන සේනාවෝ නැවතත් යුද්ධයට පෙරළා පැමිණෙති.

> **ඉතා අලජ්ජී වූ දුෂ්ට වූ කේවට්ටයා අසු නැඟී, කටින් ලේ දම-දමා නළලේ ලේ පිස-පිස දිවන්නේ ය. සේනාවට ආසන්න ව අසු පිට ම හිඳ, පින්වත්නි, නො යවග මම ගොවියා පුතු නොවැන්දෙමි. සිටුව, සිටුව යි කී ය ....**

මහෞෂධ පඬිතුමාගේ ප්‍රඥාව නොවන්නට කේවට්ට බමුණාගේ රහස් මන්ත්‍රණයේ පරිදි කටයුතු කළේ නම් එක් සියයක් රජවරුන් අකාලයේ මිය යාමට අවස්ථාව තිබණි. ඉන් රට වැසියන් පත්වන තත්වය සුබදායක නොවේ. රජු කෙරෙහි කුපිත වන සමාජයක් නිර්මාණය වීමත් රටවැසියන්ගේ සියලු කටයුතු අඩාල වීමත් අනාගතයේ ඇති වන අසුබදායක තත්වයත් පුරෝකථනය කිරීම පවා අපහසුය.

මෙලෙස වචන විනාශකාරී භාවිතා කිරීමෙන් සමාජයක්ම පරිහානියකට පත් වන අයුරු උමන්දාව පුරා වරින් වර දක්නට ලැබේ. කේවට්ටයාගේ චරිතය ඊට මනා නිදසුනක් බව ජාතක කතාව පරිශීලනය කරන පාඨකයාට මනා ලෙස ගම්‍යමාන වේ.

හසිත හෙට්ටිආරච්චි
071-9020298

01. ගුත්තිල කාව්‍ය

i. අර්ථ රසයයෙන් මෙන්ම

ii.ශබ්ද රසයෙන් ද අනූන ය. නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

සිංහල ගද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන කෝට්ටේ අවධියේ දී, තමා අකෘතඥයෙකු නොවන බව තම ගුරුතුමා වූ තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ට ඇඟවීම සඳහා වෑත්තෑවේ හිමියන් විසින් 'ගුත්තිල කාව්‍ය' රචනා කරන ලදී. පන්සිය පනස් ජාතක පොතෙහි දෙසිය තිස් හත් වැනි ජාතක කතාව වන ගුත්තිල ජාතකය ඇසුරින් රචිත පද්‍ය 511කින් සමන්විත වූ මෙම කාව්‍ය කෘතියේ අන්තර්ගත කාව්‍ය රසය නිසාම ඛණ්ඩ සාහිත්‍ය කාව්‍ය සම්ප්‍රදායේ උසස් නිර්මාණයක් ලෙස මෙය අවිවාදයෙන් පිළිගැනේ. වෑත්තෑවේ හිමියන් විසින් රචිත වෙනත් කෘති පිළිබඳ ඉතිහාසයේ සඳහනක් නොවුණත් උන්වහන්සේ තුළ පැවැති කවි පද ගෙතීමේ හැකියාවත්, ප්‍රතිභා සම්පන්න භාවයත් ගුත්තිල කාව්‍ය තුළින් මනාව වටහා ගත හැකි ය.

ගුත්තිලය ඉතා සරල සුගම බස් වහරකින් රචනා වී ඇති කාව්‍ය කෘතියකි. ගුත්තිල පඬිතුමා සහ මූසිල අතර ඇති වූ වීණා වාදන තරඟයක් මීට වස්තු විෂය වූ අතර එම වීණා වාදනයේ සුමිහිරියාව පාඨකයාට දැනවීම සඳහා වෑත්තෑවේ හිමියන් අනුගමනය කළ කාව්‍ය උපක්‍රමයක් නම් අර්ථ රසයෙන් යුක්ත ව පද්‍ය නිර්මාණය කිරීමයි.

නො දැන ම තමා බල
සබයට අවුත් නොපැකිළ
වැඳ රද පද කමල
දෙසෙක මූසිලයා ද උන් කල

කවියක් රසවත් වන්නේත් ගීතවත් වන්නේත් සරල භාෂාව හේතු කොටගෙන ය. සරල භාෂාව තුළ ගැබ්ව ඇත්තේ අර්ථ රසය යි. ගුත්තිල පඬිතුමා සභාවේ පැත්තක සූදානම් කරන ලද සුදුසු ආසනයක හිඳගත් කල්හි, මූසිලයාද තමන්ගේ තරම නොදැන කිසිම පැකිලීමක් නැතිව රජුගේ පාද නැමැති පද්මය වැඳ වේදිකාවේ පසෙක සිට ගත් ආකාරය මෙලෙස සරල භාෂාවක් යොදාගෙන ප්‍රබල ලෙස මතු කිරීමට කතුහිමියන් සමත් වෙයි. කවියක් මවන අර්ථ රසය, කවියේ රසය ප්‍රබල කිරීමට හේතු වෙයි.

පිය සන් නො ව බිගු දැල් රැඳි කොපුලී
අවසන් නො ව වෙණ නදට ම කුහුලී
මද සන් සුන් පියොවින් සිටි නොසැලී
ගජ සෙන් සිතියම් ගජ සිරි කියෙලී

ගුත්තිල කවියා යොදාගෙන ඇත්තේ කාව්‍යමය බවින් පරිපූර්ණ ගීතවත් බස් වහරකි. වීණා වාදනය කෙරෙහි බැඳුණු සිත් ඇති ඇතුන් තම දෙකපුලෙහි වසා සිටින මී මැස්සන් පලවා හැරීමටට ද නොසිතා සිතියම් වල ඇතුන් මෙන් නිසොල්මන්ව සිටීම පාඨකයාට වීණා වාදනයේ මිහිරි බව වටහා ගැනීමට මනා ලෙස උපකාරී වේ. මෙය වීණා වාදනයේ මිහිරි බව විදහා පෑමට කවියා තුළ තිබූ කාව්‍ය ප්‍රතිභාව මෙන්ම අවස්ථාවෝචිත රූපක භාවිතය තුළින් පාඨකයාගේ සිත් වල සිද්ධි නිරූපණය කිරීම සඳහා ද කවියා තුළ තිබූ කුසලතාවය නිරූපණය කරයි. මෙලෙස සිද්ධි නිරූපණය කිරීම හරහා කවියේ කාව්‍ය රසය වැඩි දියුණු කිරීමට අර්ථ රසය යොදා ගැනීමට ගුත්තිල කතුවරයා සමත් වී තිබේ.

දිය දිය ගොස පළ කෙරෙමින් සපැමිණි
ගිය ගිය තැන ඉස්වා රන් මුතු මිණි
ගිය ගිය දිය නද එන මෙන් ගෙන මිණි
සිය සිය ගුණයෙන් වෙණ නද නික්මිණි

ගුත්තිල කාව්‍ය කන්කළු කාව්‍යයකි. ඇසීමට ප්‍රිය උපදවන කාව්‍ය නාදය එහි ආත්මය බවට පත්වී තිබේ. වීණා වාදනය ලෝකයේ පතුරුවා හරිමින් ගිය ගිය ස්ථානවල රන් මුතු මැණික් විසුරුවමින් පිටව ගියා වූ ජනනාදය ප්‍රතිරාව ගෙන එන්නා සේ සිය සිය ගුණයෙන් වීණා නාදය නිකුත්ව දස දෙස පැතිර ගියේ ය. අවශ්‍ය අවස්ථාවල දී 'ගිය ගිය' 'දිය දිය' 'සිය සිය 'ආදී ලෙස අනුප්‍රාස රසය ද කුළු ගන්වමින් විවිධ විරිත් භාවිත කරමින් රචිත ගුත්තිල කාව්‍ය ශබ්ද රසයෙන් අනූනය. එසේම සෑම කවියකම එළිවැට, එළිසමය ද දැකගත හැකිය. මෙයින් ශබ්ද රසය වඩාත් තීව්‍ර වෙයි.

රෑ රැසේ අඳිනා ලෙසේ අත්
ලෙළ දිදී විදුලිය පබා
රන් රසේ එක් වන ලෙසේ වෙණ
නාදනු පා තබ තබා
කම්පසේ දෙන සැර ලෙසේ දෙස
බල බලා නෙතගින් සබා
මම් කෙසේ පවසම් එසේ වර
සුර ළඳුන් දුන් රඟ සුබා

ගුත්තිල කවියා එකම විරිත භාවිතා නොකර යි. ශබ්ද රසය තම කවියේ ආත්මය බවට පත් කරමින් විවිධ විරිත් භාවිත කරයි. ඇතැම් විට ඉතා කෙටි විරිතක් ද ඇතැම් විට දිගු විරිතක් ද භාවිතා කරන කතුවරයා රෑ රැසේ අඳිනා ලෙසේ ආදී වශයෙන් වීණා වාදනයට පැමිණෙන සුර ළඳුන් පිළිබඳ සුමිහිරි වර්ණනාවක යෙදෙමින් මුල මැද අග එළිසමය රැකගනිමින් මාත්‍රා 26 ක සවිසිමත් නුපුන් සඳ විරිතෙන් රචනා කළ උක්ත නිදසුනෙන් ශබ්ද රසය තම නිර්මාණයටට දායක කරගත් ආකාරය මනාව පැහැදිලි වේ.

මෙලෙස අර්ථ රසය ද උචිත ආකාරයට ශබ්ද රසය ද යොදා ගනිමින් උසස් කාව්‍ය නිර්මාණයක් සහෘදයාට දායාද කිරීමට වෑත්තෑවේ හිමියෝ සමත් වූහ.

Hasitha hettiarachchi
071-9020298

හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

02. i) උපමා භාවිතය

ii) උචිත සජීවී අවස්ථා නිරූපණය ගුත්තිල කාව්‍යයේ සාර්ථකත්වයට හේතු වී ඇති අයුරු පහදන්න. (එකකට උදාහරණ දෙක බැගින් ගෙන වචන 125 ක් පමණ සෑහේ)

(ලකුණු 15)

සිංහල ගද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන කෝට්ටේ අවධියේ දී, තමා අකෘතඥයෙකු නොවන බව තම ගුරුතුමා වූ තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ට ඇඟවීම සඳහා වෑත්තෑවේ හිමියන් විසින් 'ගුත්තිල කාව්‍ය' රචනා කරන ලදී. පන්සිය පනස් ජාතක පොතෙහි දෙසිය තිස් හත් වැනි ජාතක කතාව වන ගුත්තිල ජාතකය ඇසුරින් රචිත පද්‍ය 511කින් සමන්විත වූ මෙම කාව්‍ය කෘතියේ අන්තර්ගත කාව්‍ය රසය නිසාම ඛණ්ඩ සාහිත්‍ය කාව්‍ය සම්ප්‍රදායේ උසස් නිර්මාණයක් ලෙස මෙය අවිවාදයෙන් පිළිගැනේ. වෑත්තෑවේ හිමියන් විසින් රචිත වෙනත් කෘති පිළිබඳ ඉතිහාසයේ සඳහනක් නොවුණත් උන්වහන්සේ තුළ පැවැති කවි පද ගෙතීමේ හැකියාවත්, ප්‍රතිභා සම්පන්න භාවයත් ගුත්තිල කාව්‍ය තුළින් මනාව වටහා ගත හැකි ය.

ගුත්තිල කාව්‍ය රචනා කිරීමේදී උපමා භාවිතා කිරීම බොහෝ අවස්ථාවල දක්නට ලැබේ. ගුත්තිල පඬිතුමා සහ මූසිල අතර ඇති වූ වීණා වාදන තරඟයක් මීට වස්තු විෂය වූ අතර එම වීණා වාදනයේ සුමිහිරියාව පාඨකයාට දැනවීම සඳහා වෑත්තෑවේ හිමියන් අනුගමනය කළ කාව්‍ය උපක්‍රමයක් ලෙස එය දැක ගත හැකිය.

දෙදෙන ම ඉඳ දෙ පිට
සව් සත සතන් තුටු කොට
සුර ගඳඹුන් ලෙසට
පටන් ගෙන වෙණ ගායනාවට

වීනා වාදනය ආරම්භ කරන විට "දෙදෙනම ඉඳ දෙපිට" යන පද්‍ය පාදයෙන් ගුත්තිල හා මූසල යන දෙදෙනාම දෙපස ඉඳගෙන සියලු සත්වයන්ගේ සිත් සතුටු වන ආකාරයෙන් වීණා වාදනය ආරම්භ කළ බව කතුවරයා නිරූපණය කර ඇත. ගුත්තිල හා මූසිල යන දෙදෙනාම එක හා සමාන දක්ෂතා සහිතව වීණා වාදනය සිදු කළ බව "සුර ගඳඹුන් ලෙසට" යන උපමාවෙන් ඔවුන් උපමා කොට දැක්වීම නිසා පැහැදිලි වේ. "සුර ගඳඹුන්" යනු දිව්‍ය ගාන්ධර්වයන් ය. ගුත්තිල හා මූසිල යන දෙදෙනාම සුර ගඳඹුන්ට සමාන කිරීමෙන් වීණා වාදනයේ ඔවුන්ට තිබූ ශක්‍යතාව මනා ලෙස උද්දීපනය වෙයි.

රූ රැසේ අඳිනා ලෙසේ අත්
ලෙළ දිදී විදුලිය පබා
රන් රසේ එක් වන ලෙසේ වෙණ
නාදනු පා තබ තබා...

විදුලිය වැනි අත් ලෙළ දෙමින් සුර ළඳුන් විසින් වීණා නාදයට අනුව නර්තනය ඉදිරිපත් කරන ආකාරය රූප රාශියක් අඳිනවා ලෙස කතුවරයා උපමාවකින් දක්වයි. රත්තරන් හා රසදිය එකතු වනවා සේ වීණා නාදයට අනුව පාද තබමින් ඉදිරිපත් කරන රංගනය කෙතරම් මිහිරිද යන්න පාඨකයාට සරල උපමා භාවිතයෙන් පැහැදිලි කිරීමට කතු හිමියන් සමත් වී ඇති බව පූර්වෝක්ත පද්‍යයෙන් පැහැදිලි වේ.

නිති නිරිඳුගෙරැකවලෙහි නියුත්තෝ
රැති ලෙස රුපුනොද බිඳ ජය ගත්තෝ
පැති රෙන වෙණ නද බැඳුණු සිතැත්තෝ
අති නවි ගිලිහෙන බව නොම දත්තෝ

නිරන්තරයෙන් රජුගේ රැකවලෙහි යෙදී සිටින, තමන්ට කැමති පරිදි සතුරන්ගේ ඔද බිඳ ජය ගත්, පැතිරෙන වීණා නාදය කෙරෙහි බැඳුණු සිත් ඇති සේනාවෝ තමන්ගේ අතින් ආයුධ ගිලිහෙන බව නොම දත්හ. වීණා නාදය මිහිර එතරම් රසවත් ය. මෙලෙස වීණා වාදනය සිදු කරන එම අවස්ථාව සජීවී ලෙස පාඨකයා පාඨකයා තුළ චිත්ත රූප ජනනය වන ආකාරයෙන් ඉදිරිපත් කිරීමට කතුහිමියන් සමත් වෙයි. රජුගේ නිත්‍ය රැකවරණයෙහි යෙදී සිටි ආරක්ෂක භටයන් අතින් අවි ගිලිහීම ඔවුන්ට දඬුවම් ලැබීමට හේතු වෙයි. එසේ විය හැකි විපත පවා වීණා නාදය ඇසීමෙන් සිහිපත් නො වී ගිය බව මෙයින් හැඟවෙයි.

මන මත් කරවන දන මුළු දෙරණා
රසවත් වන වෙණ නද නද කරණා
සවනොත් සඳ පුරඟන ලොබ දිවුණා
නොදනිත් දරුවන් ඇකයෙන් වැටුණා

මුළු පොළෝ තලයෙහි ජනයන්ගේ සිත් මත් කරවන, කරණයන් නද්ධ වූ, රසවත් වන වෙණ නද, කන්වල වැටුණු කල, ආශාව වැඩි කළ පුරාංගනාවෝ තම දරුවන් ඇකයෙන් වැටුණු බව නො දනිති. නගරයේ වූ කාන්තාවන් ගේ සැබෑ තත්ත්වය උක්ත පද්‍යයෙන් නිරූපණය වේ. මවකට තම දරුවන් යනු ඉතා වටිනා සම්පතකි. දරුවන් ඇකයෙන් වැටුණු බව නොදැනිණි යැයි කීම, වීණාවාදනයේ රසවත් බවත් එම අවස්ථාවේ තිබූ නගරයේ ස්වභාවයක් සහෘදයාට මනා ලෙස වටහා ගැනීමට උපකාරී වේ.

මෙලෙස උචිත සජීවි අවස්ථා නිරූපණය කරමින් උචිත උපමා යොදා ගනිමින් උසස් කාව්‍ය නිර්මාණයක් සහෘදයාට දායාද කිරීමට වෑත්තෑවේ හිමියෝ සමත් වූහ.

Hasitha hettiarachchi
071-9020298

හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

03. ඒ ඒ අවස්ථාවට ගැළපෙන ලෙස වීරිත වෙනස් කිරීමට කතුවරයා තුළ වූ ප්‍රතිභාව ගුත්තිල කාව්‍යය වඩාත් රසවත් වන්නට හේතු වී ඇත. උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

සිංහල ගද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන කෝට්ටේ අවධියේ දී, තමා අකෘතඥයෙකු නොවන බව තම ගුරුතුමා වූ තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ට ඇඟවීම සඳහා වෑත්තෑවේ හිමියන් විසින් 'ගුත්තිල කාව්‍ය' රචනා කරන ලදී. පන්සිය පනස් ජාතක පොතෙහි දෙසිය තිස් හත් වැනි ජාතක කතාව වන ගුත්තිල ජාතකය ඇසුරින් රචිත පද්‍ය 511කින් සමන්විත වූ මෙම කාව්‍ය කෘතියේ අන්තර්ගත කාව්‍ය රසය නිසාම ඛණ්ඩ සාහිත්‍ය කාව්‍ය සම්ප්‍රදායේ උසස් නිර්මාණයක් ලෙස මෙය අවිවාදයෙන් පිළිගැනේ. වෑත්තෑවේ හිමියන් විසින් රචිත වෙනත් කෘති පිළිබඳ ඉතිහාසයේ සඳහනක් නොවුණත් උන්වහන්සේ තුළ පැවැති කවි පද ගෙතීමේ හැකියාවත්, ප්‍රතිභා සම්පන්න භාවයත් ගුත්තිල කාව්‍ය තුළින් මනාව වටහා ගත හැකි ය.

ගුත්තිල කාව්‍යයෙහි එන වීරිත් පිළිබඳ අධ්‍යයනයේ දී විවිධ වීරිත් ගත්කරුවා විසින් භාවිතා කොට තිබේ. ගී වීරිත, වසත් වීරිත, සමුදුරු ගොස් වීරිත(සමු ද්‍ර ඝෝෂ වීරිත, සක්වා වීරිත, උවදෑ වීරිත, පදක වීරිත, මාත්‍රා විසි හයකින් යුත් සවිමත් වීරිත ආදී විවිධ වීරිත්වලින් යුක්ත පද්‍ය රාශියක් ම ගුත්තිල කාව්‍යයෙහි අන්තර්ගතය. ගුත්තිල කාව්‍ය මුල් කොටසේදී ඉතාම කෙටි වීරිත් සහ සරල භාෂාවක් භාවිතා කරන කතුවරයා අවස්ථානෝචිත ව අවස්ථාවට ගැළපෙන අයුරින් සිය වීරිත වෙනස් කරයි.

නො දැන ම තමා බල
සබයට අවුත් නොපැකිළ
වැඳ රද පද කමල
දෙසෙක මුසිලයා ද උන් කල

කවියක් රසවත් වන්නේත් ගීතවත් වන්නේත් ශබ්ද රසය හේතු කොටගෙන ය. ගුත්තිල පඬිතුමා සභාවේ පැත්තක සූදානම් කරන ලද සුදුසු ආසනයක හිඳගත් කල්හි, මුසිලයාද තමන්ගේ තරම නොදැන කිසිම පැකිලීමක් නැතිව රජුගේ පාද නැමැති පද්මය වැඳ වේදිකාවේ පසෙක සිට ගත් ආකාරය මෙලෙස කෙටි වීරිතක් යොදාගෙන ප්‍රබල ලෙස මතු කිරීමට කතුහිමියන් සමත් වෙයි. කවියක් මවන ශබ්ද රසය, කවියේ රසය ප්‍රබල කිරීමට හේතු වෙයි.

දිය දිය ගොස පළ කෙරෙමින් සපැමිණි
ගිය ගිය තැන ඉස්වා රන් මුතු මිණි
ගිය ගිය දිය නද එන මෙන් ගෙන මිණි
සිය සිය ගුණයෙන් වෙණ නද නික්මිණි

ගුත්තිල කාව්‍ය කන්කළු කාව්‍යයකි. ඇසීමට ප්‍රිය උපදවන කාව්‍ය නාදය එහි ආත්මය බවට පත්වී තිබේ. වීණා වාදනය ලෝකයේ පතුරුවා හරිමින් ගිය ගිය ස්ථානවල රන් මුතු මැණික් විසුරුවමින් පිටව ගියා වූ ජනනාදය ප්‍රතිරාව ගෙන එන්නා සේ සිය සිය ගුණයෙන් වීණා නාදය නිකුත්ව දස දෙස පැතිර ගියේ ය. මෙහිදී කතුහිමියන් දස දිසාවන්හි පැතිරෙන වීණා නාදයේ අසිරිය චමත්කාර ලෙස වර්ණනා කිරීමට මාත්‍රා දහසයකින් බැඳි 'පදක වීරිත' භාවිතා කර ඇත. සතර සතර මතින් විරාමය හෙවත් නැවතීම ඇතිවන මාත්‍රා 16කින් යුතුව බැඳි වීරිත 'පදක වීරිත' ලෙස නම්කරයි.

රූ රැසේ අඳිනා ලෙසේ අත්
ලෙළ දිදී විදුලිය පබා
රන් රසේ එක් වන ලෙසේ වෙණ
නාදනු පා තබ තබා
කම්පසේ දෙන සැර ලෙසේ දෙස
බල බලා නෙතගින් සබා
මම් කෙසේ පවසම් එසේ වර
සුර ළඳුන් දුන් රඟ සුබා

ගුත්තිල කවියා එකම විරිත භාවිතා නොකර විවිධත්වයෙන් යුතුව විරිත් භාවිතා කළ බවට උක්ත පද්‍ය හොඳ නිදසුනකි. මෙහිදී ඉතා දිගු විරිතක් භාවිතා කරන කතුවරයා රූ රැසේ අඳිනා ලෙසේ ආදී වශයෙන් වීණා වාදනයට පැමිණෙන සුර ළඳුන් පිළිබඳ සුමිහිරි වර්ණනාවක යෙදෙමින් සුරඟන රැඟුමෙහි අලංකාරය තීව්‍ර කිරීමට සමත් වෙයි. මුල මැද අග එළිසමය රැකගනිමින් මාත්‍රා 26 ක සවිසිමත් නුපුන් සඳ විරිතෙන් රචනා කළ උක්ත නිදසුනෙන් ඒ ඒ අවස්ථාවට ගැළපෙන ලෙස විරිත වෙනස් කරමින් තම නිර්මාණයට දායක කරගත් ආකාරය මනාව පැහැදිලි වේ.

මෙලෙස ගුත්තිල කාව්‍ය නිර්මාණය කළ වෑත්තෑවේ හිමියෝ විවිධ විරිත් යොදා ගනිමින් තම ප්‍රතිභාව ඉතා මැනවින් ප්‍රකට කරමින් විවිධ අවස්ථාවන් වඩ වඩාත් සජීවීව සහෘදයාට සමීප කරවීමට සමත් වේ. ඇතැම් විටෙක පද දෙකින් දෙකට විරාමය වැටුණ අවස්ථා යොදාගෙන ඇති අතර තවත් අවස්ථාවක දිගු විරිතක් භාවිතා කරයි. එය අවස්ථාවට ගැළපෙන ලෙස විරිත වෙනස් කිරීමට කතුවරයා තුළ වූ ප්‍රතිභාව යි. ගුත්තිල කාව්‍යය වඩාත් රසවත් වන්නේ මෙලෙස ඒ ඒ අවස්ථාවට ගැළපෙන ලෙස විරිත වෙනස් වෙනස් කිරීම නිසා බව මැනවින් විශද වෙයි.

Hasitha hettiarachchi
071-9020298

හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

01. 'අවවාද අනුශාසනා දීමේ දී කවියා ඉතා සංයමයෙන් එම කාර්යය ඉටු කරන්නට වග බලා ගනී' මේ ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ දැ'යි හේතු සහිත ව විස්තර කරන්න. (ලකුණු 10)

ජනශ්‍රැති සාහිත්‍යයට අයත් 'ජන කවි' වූ කලී උපමා උපදේශ ප්‍රස්තාව පිරුළු වලින් පෝෂිත ජන සාහිත්‍යාංගයක් වේ. එදිනෙදා ජීවිතයේ විවිධ ක්ෂේත්‍රයන් සහ විවිධාකාර සංසිද්ධීන් ඇසුරෙන් ලබාගත් අත්දැකීම් උකහා ගත් ජනකවියා හරවත් ඔවදන් සමුදායක් මගින් පොදුජන හදවත් ස්පර්ශ කරන්නට සමත් වෙයි. ස්වකීය පරිසරයෙන් උකහා ගත් ඥාන ධාරාවන් තුළින් සිය ප්‍රතිභා ශක්තිය මෙහෙයවා අවස්ථානෝචිතව අවවාද අනුශාසනා දීමේ දී කවියා ඉතා සංයමයෙන් එම කාර්යය ඉටු කරන්නට ජන කවියා සමත් වූ ආකාරය නිර්මාණශීලීය. විචිත්‍රය. ජාතික අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කර ඇති 'සිංහල ජනකවි සංග්‍රහයෙන්' උපුටා ගත් උපදේශාත්මක ජන කවි කිහිපයක් මෙහිදී විමසුමට ලක් කෙරේ.

ගසට කෙටුම ගස මුල පෑයුමෙන් දැනේ
මිනිහා නොමිනිහා යන කඩිසරෙන් දැනේ
අමුතු බත් දීම අත ඇල්ලුමෙන් දැනේ
හානා හීය පානා අඬහැරෙන් දැනේ

කිසියම් කාර්යයක යෙදේ නම් එම කාර්යයෙහි යෙදෙන්නා එම වැඩෙහි නිරතවන පිළිවෙළ අනුව යථාවබෝධයක් ලබාගත හැකිය යන මාහැඟි උපදේශය මෙයින් ගම්‍යමාන වෙයි. ගසක් කපන්නට පෙර ගැමියා විසින් ගස මුල ඇති වල් පැල මුලිනුදුරා දමයි. වර්තමානයේ මෙන් තාක්ෂණික මෙවලම් නොතිබුණු අද්‍යතන යුගයේ ප්‍රධාන ආයුධය වූයේ පොරවයි. මහත් වැර වීරියෙන් පොරව පහරවල් ගසා එය බිම හෙළීමට පෙර ගස් කපන්නා නියුතු කාර්යයෙන් ඔහු කරන්නේ කුමක් දැ'යි රසිකයාට මැනවින් හැඟෙයි. තව ද මිනිසාගේ ගමනේ ස්වරූපයෙන් ම ඔහුගේ චර්යාවන් පහසුවෙන් හඳුනා ගැනීමට හැකි වෙයි. උදාසීන වූ කම්මැලි මිනිසුන්ගේ ස්වභාවය ඔහුගේ ගමනේ ස්වභාවයෙන් ම අවබෝධ කර ගත හැකි ය.

ගැමි සමාජයේ නිවසට පැමිණෙන අමුත්තෙකුට ආගන්තුක සත්කාර නොපිරිහෙලා ඉටු කිරීම නිවැසියන් විසින් සිදුකරති. ඔවුන් නිවසට එනවිට ආදරයෙන් පිළිගෙන ආහාර ගැනීමට ආරාධනා කරයි. එය අවංක සිතින් කරන්නේ නම් අමුත්තාගේ අතින් අල්ලා ගෙන යෑමට ද ගැමියෝ උත්සුක වෙති. එහෙත් වැලමිටෙන් ඇල්ලුවහොත් අත දිගහරිනවාත් සමගම ලිස්සා යනු නිසැක ය. බොරු සෙනෙහසක් මවා පා වංක සිතින් අමුත්තන්ට බතට ආරාධනා කරන ආකාරය මින් ගම්‍යමාන වෙයි. මෙලෙස කෙනකුගේ හැසිරීම් රටාව තුළින් එම තැනැත්තා හඳුනා ගැනීම අපහසු නොවන බව ඉතා සංයමයෙන් සහ මැනවින් විශද කිරීමට ජන කවියා සමත් වී ඇත.

ඇස නැති දා පොත ගත්තේ කියන්ට ද
දත නැති දා උක් දඬු ගිනි තපින්ට ද
වෙර නැති දා ගහගත්තේ දින්නට ද
යුද ඇති දා නැති කග කොස් කොටන්ට ද

ඇස් පෙනෙන කාලයේදී පොත පත කියවිය යුතු බවටත් දත් ඇති තරුණ වයසේදී උක් දඬු හපන්නටත් උපදෙස් දෙන ජනකවියා ඇස් නොපෙනෙන කාලයේ පොත් ගන්නේ කුමකට දැයි අසයි. දත් නැති කළ උක්දඬු රස විඳිය නොහැකි බැවින් ඒවා ගිනි තපින්නට දැයි අසයි. මහලු වයසේ අඬ දබර කර ගැනීම නුසුදුසු බව පෙන්වා දෙයි. තාක්ෂණික අවි ආයුධ නොතිබුණු එකල යුද්ධයට කඩුව වටිනා ආයුධයකි. යුද්ධයට නැති කඩුව කොස් කෙටීම වැනි නුසුදුසු ක්‍රියාවකට දැයි කවියා ප්‍රශ්න කරයි. මෙලෙස ප්‍රශ්නමය ආකාරයේ ජනකවි තුළින් යහපත් ජීවිතයකට අගනා උපදෙස් සපයන්නට ජනකවියා වෙහෙසෙයි.

නහින දෙහින කාලෙට පින් කෙරුම යුත
වහින කලට කූරින් විල්වලින් එත
බහින දියෙන් දෝතක් මුත් ගතොත් ඇත
පනින රිලවුංට ඉනිමං කමක් නැත

සිංහල ජන කවියා තමා අවට පරිසරයෙන් ලද දැනුමෙන් පෝෂිතව ජන කවි නිර්මාණය කරයි. නහින-දෙහින කාලය යනු මහලු කාලය යි. මෙකල කළ යුත්තේ පින් දහම් කිරීම බව ජනකවියා අවධාරණය කරයි. පද්‍ය පාද එකෙන් එකට එතරම් සම්බන්ධයක් නැතත් ඉන් අවධාරණය කරන හැඟීම්, ජන කියමන්, ප්‍රබල ය. වැස්ස යනු මත්ස්‍යයන්ට මහඟු දායාදයකි. වැසි කලට මසුන් විල් වලින් ඉල්පෙයි. ගලා යන දිය දෝතක් ගත්තත් එය ප්‍රමාණවත් බව කවියා උපකල්පනය කරයි. එලෙසම පනින රිලවුන්ට ඉනිමං බැඳීමෙන් වැඩක් නැති බව කවියා අවධාරණය කරයි. යම් කාර්යයන්හි හුරුකම් ඇති අයට අතිරේක සහයක් අවශ්‍ය නොවන බව සංයමයෙන් කියා පාන්නට ජන කවියා සමත් වී ඇත්තා සේ ය. මෙලෙස අවවාද අනුශාසනා දීමේ දී කවියා කිසිවකුගේ සිත් නොරිදවා ඉතා සංයමයෙන් එම කාර්යය ඉටු කරන්නට වග බලා ගත් බව උක්ත නිදසුන් වලින් මනාව පැහැදිලි වේ.

Hasitha hettiarachchi
071-9020298

02. යහපත් ජීවිතයක් සඳහා ජන කවියෙන් ලද හැකි ආභාසය උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ජනශ්‍රැති සාහිත්‍යයට අයත් 'ජන කවි' වූ කලී උපමා උපදේශ ප්‍රස්තාව පිරුළු වලින් පෝෂිත ජන සාහිත්‍යාංගයක් වේ. එදිනෙදා ජීවිතයේ විවිධ ක්ෂේත්‍රයන් සහ විවිධාකාර සංසිද්ධීන් ඇසුරෙන් ලබාගත් අත්දැකීම් උකහා ගත් ජනකවියා හරවත් ඔවදන් සමුදායක් මගින් පොදුජන හදවත් ස්පර්ශ කරන්නට සමත් වෙයි. ස්වකීය පරිසරයෙන් උකහා ගත් ඥාන ධාරාවන් තුළින් සිය ප්‍රතිභා ශක්තිය මෙහෙයවා අවස්ථානෝචිතව කාව්‍යෝක්තීන් නිරූපණය කිරීමට ජන කවියා සමත් වූ ආකාරය නිර්මාණශීලීය. විචිත්‍රය. ජාතික අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කර ඇති 'සිංහල ජනකවි සංග්‍රහයෙන්' උපුටා ගත් උපදේශාත්මක ජන කවි කිහිපයක් මෙහිදී විමසුමට ලක් කෙරේ.

එක් උන දාට උක් දණ්ඩේ පැණි	සේමා
වෙන් උන දාට යක් දෙබරේ වද	සේමා
ගොසින් ගොසින් කටු අත්තේ අග	සේමා
ඉතින් ළඳේ කරිවිල තිබ්බටු	සේමා

විවාහයකදී ප්‍රේමවන්තයින්ගේ එක්වීම සහ වෙන්වීම වැනි සංකීර්ණ මානුෂික සංසිද්ධියක් තේමා කරගත් ජනකවියා එහි යථාර්ථය ජීවමාන ආකාරයෙන් හෙළිදරව් කරන ආකාරය රසවත් ය. හරවත් ය. විවාහය උක්දඬු වල පැණි සේ රසවත්ය. නමුත් කාලයේ ඇවෑමෙන් අමිල ප්‍රේමය වියැකී ගොස් නිරුද්ධ වන අයුරු යක් දෙබරයක් සේ කවියා උපකල්පනය කරයි. දෙබරුන් බිම බඳින වදයේ (යක් දෙබරේ) පැණි නොමැත. නමුත් එවන් දෙබරයක් කැලඹුණ හොත් සිදුවන ව්‍යසනය සුලුපටු නොවේ. එය ක්‍රමයෙන් හීන වී යාම කටු අත්තක අගට උපමා කරන කවියා කොතරම් ගුණ වුවද ඉතා තිත්ත කරිවිල, තිබ්බටු මෙන් විවාහ ජීවිතය කටුක බව නිරූපණය කරයි. බිඳුනු විවාහ ජීවිතයක යථාර්ථය ජනකවියා විනිවිද දකින්නට සමත් වුවා සේය. විවාහ ජීවිතයේ කටුක බව විවාහට පෙර අවබෝධ කරගත් පුද්ගලයාට සාර්ථක විවාහයක් ගත කිරීම සඳහා මින් ලැබෙන පිටුවහල ප්‍රශංසනීය ය.

ඇස නැති දා පොත ගත්තේ	කියන්ට ද
දත නැති දා උක් දඬු ගිනි	තපින්ට ද
වෙර නැති දා ගහගත්තේ	දින්නට ද
යුද ඇති දා නැති කග කොස්	කොටන්ට ද

ඇස් පෙනෙන කාලයේදී පොත පත කියවිය යුතු බවටත් දත් ඇති තරුණ වයසේදී උක් දඬු හපන්නටත් උපදෙස් දෙන ජනකවියා ඇස් නොපෙනෙන කාලයේ පොත් ගන්නේ කුමකට දැයි අසයි. දත් නැති කළ උක්දඬු රස විඳිය නොහැකි බැවින් ඒවා ගිනි තපින්නට දැයි අසයි. මහලු වයසේ අඩ දබර කර ගැනීම නුසුදුසු බව පෙන්වා දෙයි. තාක්ෂණික අවි ආයුධ නොතිබුණු එකල යුද්ධයට කඩුව වටිනා ආයුධයකි. යුද්ධයට නැති කඩුව කොස් කෙටීම වැනි නුසුදුසු ක්‍රියාවකට දැයි කවියා ප්‍රශ්න කරයි. මෙලෙස ප්‍රශ්නමය ආකාරයේ ජනකවි තුළින් යහපත් ජීවිතයකට අගනා උපදෙස් සපයන්නට ජනකවියා වෙහෙසෙයි.

රන් විමනේ සිටි මුත් දුක නැති	වෙද්ද
පැණි මීයේ කෑ මුත් බඩ ගිනි	නැද්ද
මිණි බරණින් සැදු මුත් ගත	නොදිරද්ද
පැණිවරකා ගසටත් හෙණ	නොවදිද්ද

උපමා උපමේය දෙක එක්කොට ජීවමාන ආකාරයෙන් සහෘදයාගේ හැඟුම් උද්දීපනය කිරීමට ජන කවියා සමත් වූ බව පූර්වෝක්ත පද්‍යයෙන් පසක් වේ. එහි සංක්ෂිප්තාර්ථ මෙන්ම සංකේතාර්ථ ද ගැබ් වී ඇත්තා සේය. පැණි වරකා ගස යනු ගම්බද ගැමියාගේ වටිනා වස්තුවකි. මෙයින් සංකේතවත් වන්නේ සමාජයේ ඕනෑම කෙනෙකුට වුවද විපතක් වීමට හැකියාව ඇති බවයි. රන් විමානයක සිටියත් සියලු දෙනාට දුක් විපත් වලට මුහුණ දීමට සිදුවේ. ඉතා රසවත් පැණි මීයක් ආහාරයට ගත්තද බඩගින්න නැති වන්නේ නැත. මැණික් ආභරණ ආදියෙන් සරසා තිබුණත් ශරීරය දිරාපත් නොවී තිබෙන්නේ ද නැත.

මෙලෙස ප්‍රශ්නමය ආකාරයේ ප්‍රස්තාව පිරුළු උපමාලංකාර, කාව්‍යයෝක්ති ආදියෙන් යුක්ත ව සරල භාෂාවකින් නිර්මාණය වුණු ජනකවිය තුළින් සාරධර්මය ජනනය වන උපදෙස් මාලාවක් තිළිණ කරන්නට ජන කවියා සමත් වුවා සේ ය. ආයාසයකින් තොරව අත්දැකීම් අනුසාරයෙන් ශ්‍රාවකයාගේ අති ප්‍රබල වූ ඥානාලෝකය උද්දීප්ත කිරීමට කවියා සමත් සමත් වූ බව කිව හැකි ය. යහපත් ජීවිතයක් සඳහා ජන කවියෙන් ලද හැකි ආභාසය අපමණ ය.

Hasitha hettiarachchi
071-9020298

03. ජන කවියා තම නිර්මාණය රසවත් කිරීමෙහි ලා කාව්‍යාලංකාර යොදා ගෙන ඇති ආකාරය උදාහරණ මගින් පහදන්න. (ලකුණු 10)

ජනශ්‍රැති සාහිත්‍යයට අයත් 'ජන කවි' වූ කලී උපමා උපදේශ ප්‍රස්තාව පිරුළු වලින් පෝෂිත ජන සාහිත්‍යාංගයක් වේ. එදිනෙදා ජීවිතයේ විවිධ ක්ෂේත්‍රයන් සහ විවිධාකාර සංසිද්ධීන් ඇසුරෙන් ලබාගත් අත්දැකීම් උකහා ගත් ජනකවියා හරවත් ඔවදන් සමුදායක් මගින් පොදුජන හදවත් ස්පර්ශ කරන්නට සමත් වෙයි. ස්වකීය පරිසරයෙන් උකහා ගත් ඥාන ධාරාවන් තුළින් සිය ප්‍රතිභා ශක්තිය මෙහෙයවා අවස්ථානෝචිතව කාව්‍යෝක්තීන් නිරූපණය කිරීමට ජන කවියා සමත් වූ ආකාරය නිර්මාණශීලීය. විචිත්‍රය. ජාතික අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කර ඇති 'සිංහල ජනකවි සංග්‍රහයෙන්' උපුටා ගත් උපදේශාත්මක ජන කවි කිහිපයක් මෙහිදී විමසුමට ලක් කෙරේ.

එක් උන දාට උක් දණ්ඩේ පැණි සේමා
වෙන් උන දාට යක් දෙබරේ වද සේමා
ගොසින් ගොසින් කටු අත්තේ අග සේමා
ඉතින් ළඳේ කරිවිල තිබ්බටු සේමා

පූර්වෝක්ත පද්‍ය පාද හතරම උපමාලංකාරයෙන් සුපෝෂිත කිරීමට ජන කවියා සමත් වී ඇත. විවාහයකදී ප්‍රේමවන්තයින්ගේ එක්වීම සහ වෙන්වීම වැනි සංකීර්ණ මානුෂික සංසිද්ධියක් ජීවමාන ආකාරයෙන් හෙළිදරව් කිරීමට පද්‍ය පාද හතර එලෙස උපමා හතරකින් සරසා ඇති ආකාරය අර්ථාන්විත ය. විවාහය උක්දඬු වල පැණි සේ රසවත්ය. නමුත් කාලයේ ඇවෑමෙන් අමිල ප්‍රේමය වියැකී ගොස් නිරුද්ධ වන අයුරු යක් දෙබරයක් සේ කවියා උපකල්පනය කරයි. දෙබරුන් බිම බඳින වදයේ (යක් දෙබරේ) පැණි නොමැත. නමුත් එවන් දෙබරයක් කැලඹුණ හොත් සිදුවන ව්‍යසනය සුලුපටු නොවේ. එය ක්‍රමයෙන් හීන වී යාම කටු අත්තක අගට උපමා කරන කවියා කොතරම් ගුණ වුවද ඉතා තිත්ත කරිවිල, තිබ්බටු මෙන් විවාහ ජීවිතය කටුක බව තවත් උපමාවකින් නිරූපණය කරයි. බිඳුනු විවාහ ජීවිතයක යථාර්ථය ජනකවියා විනිවිද දකින්නට සමත් වුවා සේ ය. විවාහ ජීවිතයේ කටුක බව විවාහට පෙර අවබෝධ කරගත් පුද්ගලයාට සාර්ථක විවාහයක් ගත කිරීම සඳහා මින් ලැබෙන පිටුවහල ප්‍රශංසනීය ය.

වරද පෙනෙන තරමට වැරදුණා නොවේ
වරද ඇතත් නිකරුණේ වැඩ කළා නොවේ
වරද පෙනෙති වැඩ නුගත් අයට ලොවේ
වරද නැති කෙනෙක් නැත සකිය මේ ලොවේ

ජන කවියා විසින් මෙම පද්‍යයේ එළිසමය සුරැකීම සඳහා 'වරද' යන වදන සිවුවරක් ද, අග එළිසමය සුරැකීම සඳහා 'නොවේ' යනුවෙන් සිව්වරක් ද යොදා ගෙන ඇත. පුන පුනා යොදාගත් අනුප්‍රාසවත් බස් වහර නිසා ශබ්ද රසය සහ අර්ථ රසය තීව්‍ර වීම නිසා රසෝද්පාදනයට එයින් ලැබෙන එළිය සුළු පටු නොවේ. ඇතැම් සම්භාව්‍ය කවීන් වදන් හෝ අක්ෂර පුන පුනා යෙදීම 'පුනරුක්ත දොස්' යනුවෙන් හඳුන්වා ඇතත් ජනකවියා පුනරුක්තය දෝෂයක් වශයෙන් නොසලකා උචිත අයුරින් අර්ථ පූර්ණ ධ්වනි පූර්ණ හැඟීම් ජනනය කිරීමට සමත් වී ඇත. වරදක් ඇති නොවන කෙනෙක් මෙලොව නැති බවත්, අන්‍යයන්ගේ වරද තමන්ගේ වරදට වඩා නුගතුන්ට පෙනෙන බවත් ජන කවියා විසින් මැනවින් ඉන්නිරූපණය කරනු ලබයි.

රන් විමනේ සිටි මුත් දුක නැති වෙද්ද
පැණි මීයේ කෑ මුත් බඩ ගිනි නැද්ද
මිණි බරණින් සැදු මුත් ගත නොදිරද්ද
පැණිවරකා ගසටත් හෙණ නොවදිද්ද

පූර්වෝක්ත පද්‍යයේ 'රන් විමනේ', 'පැණි මීයේ', 'මිණි බරණින්', 'පැණිවරකා' ආදී විශේෂණාර්ථ වූ රූපකාර්ථ පද මාලාවක් භාවිතා වේ. මෙහි ජීවයෙන් තොර උපදේශ ඉදිරිපත් කර නැත. උපමා උපමේය දෙක එක්කොට රූපකාර්ථ නිරූපණයෙන් ජනකවියා ජීවමාන ආකාරයෙන් සහෘදයාගේ හැඟුම් උද්දීපනය කිරීමට සමත් වෙයි. එහි සංකේතාර්ථයන් ද ගැබ්වී ඇත්තා සේය. 'පැණි වරකා ගස' යනු ගම්බද ගැමියාගේ වටිනා වස්තුවකි. එයට හෙණ වැදීමෙන් සංකේතවත් වන්නේ සමාජයේ ඕනෑම අයෙකුට විපතක් වීමට ඇති හැකියාවයි. එය ප්‍රභූවරුන්ට, උතුමන්ට, ධනවතුන්ට හෝ ඕනෑම අයෙකුට සිදුවිය හැකිය.

මෙලෙස උපමාලංකාර, කාව්‍යයෝක්ති ආදියෙන් යුක්ත ව සරල භාෂාවකින් නිර්මාණය වුණු ජනකවිය අනුප්‍රාස රසය, රූපක භාවිතය, එළිසමය එළිවැට ආදී වූ විවිධ කාව්‍යාලංකාර භාවිතා කරමින් සාර්ථක කර පබඳින්නට ජන කවියා සමත් වූ බව කිව හැකි ය.

Hasitha hettiarachchi
071-9020298

01. "අවුරුදු දහයකින් මුළු ගමම අලින්ට යනවා" යි නැන්චොහාමි කී අනාවැකිය ක්‍රමයෙන් සත්‍යයක් වූ අයුරු උදාහරණ දෙමින් විමසන්න. (ලකුණු 10)

ලෙනාඩ් වුල්ෆ්ගේ village in The jungle නවකතාවේ සිංහල අනුවාදය වූ බැද්දේගම නවකතාව වූ කලී ඒ. පී. ගුණරත්න ලේඛකයා විසින් රචනා කරන ලද්දකි. එහිදී දුප්පත් අහිංසක අසරණ ගැමියාගේ දුක්ඛිත භාවය සහ කුටෝපක්‍රම වලට හසු වී ක්‍රමයෙන් විනාශ වන ඔවුන්ගේ ජීවිත සිලිඳු නම් දඩයක්කරුවා හා ඔහුගේ පවුල ඇසුරෙන් ප්‍රතිනිර්මාණය කිරීමට කතුවරයා සමත් වී ඇත. වරෙක සුන්දරව දිස් වන මහ වනය නිරන්තරයෙන්ම බියකරු බව ම රැඳෙන අමුතුම තැනක් ලෙස එම නව කතාවෙන් හෙළිදරව් කෙරේ.

සිලිඳු ගමෙහි වෙසෙන දඩයක්කාරයෙකි. ගමේ ආරච්චිරාලගේ සහෝදරියක වූ ඩිංගිහාමි සමඟ විවාහ වී සිටි ඔහු ප්‍රථම දරු උපතේ දී නිවුන් දැරියන් ලැබූ බව අසා කෝප වී තම බිරියට පහර දෙයි. ඉන් ඩිංගිහාමි මිය යය. එතැන් පටන් දරු දෙදෙනා වූ හින්නිහාමිත් පුංචිමැණිකාත් රැක බලා ගත්තේ සිලිඳුගේ සහෝදරියක වූ කර්ලිනා හාමි විසිනි. පුංචිමැණිකා ආරච්චිගේ මස්සිනා වූ බබුන්සමග විවාහ වන්නේ ආරච්චිගේ අකමැත්තෙනි. මේ අතර ගමට පැමිණෙන ප්‍රනාන්දු මුදලාලි පුංචිමැණිකා සමග අනියම් සම්බන්ධයක් ඇතිකර ගැනීමට ප්‍රයත්න දරයි. එහෙත් ඔහුගේ ප්‍රයත්නය ඉටු කර ගැනීමට ගැනීමට නොහැකි වන අතර ඒ හේතුවෙන් ඔහු ආරච්චි සමඟ එක්වී සිලිඳුට හා බබුන්ට විරුද්ධව කටයුතු කරයි. හේන් ගොවිතැන සඳහා බලපත්‍ර අහි මි කරවා බොරු නඩුවකට පැටලීමෙන් බබුන් සය මසකට සිරගත කරවයි. නඩුවෙන් නිදහස් වී පැමිණෙන සිලිඳු ආරච්චි හා ප්‍රනාන්දු මුදලාලිට වෙඩි තබා මරා දමා කෝරළය වෙත ගොස් බාර වෙයි.

මෙයින් පසු මුළු බැද්දේගම සහ ගම්මුන් ක්‍රම ක්‍රමයෙන් ගමෙන් වියැකී ක්ෂය වී යන ආකාරය නවකතාකරු මැනවින් නිරූපණය කරයි. සලිඳු ජීවිතාන්තය දක්වා සිරගෙට නියම වූ බව ගම පුරා පැතිර යයි. ආරච්චිගේ මරණයෙන් පසු ඔහුගේ බිරිඳ වූ නැංචොහාමි සිය දරුවන් කැටුව කොටගොඩ ස්වකීය ඥාතීන් වෙත යයි. මෙම සංසිද්ධිය කතුවරයා සංක්ෂිප්තයෙන් ආරච්චිගේ නිවස ගරා වැටීම තුළින් නිරූපණය කර ඇත්තේ මෙසේ ය.

"ආරච්චිගේ ගෙයි වාසය කරන්ට කෙනකු නොවූයෙන් එය කැලයට ඇරිණ. ..."

ක්‍රම ක්‍රමයෙන් ගමේ උළු හෙවිලි කළ එකම ගෙය කැලයට යා වූ ආකාරය කතුවරයා මැනවින් පසක් කරයි. ගමේ ප්‍රධානියා ගේ නිවෙස ගරා වැටීම වූ කලී අන්‍ය ගෙවල්වල ගරාවැටීම සනිටුහන් කරන සංකේතයක් බඳු ය. මෙලෙස ආරච්චිගේ නිවස අභාවයට යාමත් සමඟ එය ජනශුන්‍ය වූ ගම්මානයක් බවට පත්වන ආකාරය පියවරෙන් පියවර විස්තර කරන කතුවරයා ගමේ පරිහානිය සජීවී ලෙස ඉදිරිපත් කරයි.

"ආරච්චිගේ ගෙය කැලයට යාම කැලය ගම මැදට කඩා පැනීමක් මෙන් වී. මීට පෙර කැලයට හැරුණේ ගමේ ඒ මේ කෙළවරවල තුබුණ ගෙවල් වූ හෙයින් ගම කැලය මැදට රිංගා ඒමක් එයින් වූයේ නැති."

ආරච්චිගේ ගෙය කැලයෙන් වැසී යාමත් සමඟ සිලිඳුගේ ගෙය අනෙක් ගෙවල්වලින් වෙන් වූ ආකාරය දැනගත් ගම්මු තමන් ජීවත් වන්නේ විනාශ වී යන ගමක බව තේරුම් ගනිති. එය නැංචොහාමිගේ සිතැඟියාවක් ලෙස කතුවරයා මෙමෙ ගම අලින්ට ඇරුණු ගමක් ලෙස ධ්වනිත කර ඇත්තේ මෙසේ ය.

"ළමයින් හා මහල්ලන් ද නැසී යන්නාක් මෙන් ගමත් දැන් නැසී යයි. එහි දැන් ළමයි නුපදිත්. අවුරුදු දහයකින් මුළු ගම ම අලින්ට යනවාට කිසි ම සැකයක් නැත."

මෙලෙස විසිවන සියවසේ මුල් භාගයේ මෙරට දකුණු පළාතේ ඈත පිටිසර වනගත ගම් පියසක් වූ බැද්දේගම සහ එහි වාසීන් ද විනාශයට පත් වූ ආකාරයත් එම ගම මහ වනාන්තරයෙන් වැසී ගොස් අලින් අරක්ගත් පෙදෙසක් වන බවත් කතුවරයා මැනවින් සහෘදයාට පසක් කරයි.

Hasitha hettiarachchi
071-9020298

02. "බැද්දේගම හා එහි වැසියන් ක්‍රමයෙන් අභාවයට යන ආකාරය සජීවී ලෙස නිරූපණය කරන්නට කතුවරයා භාෂාව භාවිත කර ඇති ආකාරය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.(ලකුණු 10)

ලෙනාඩ් වුල්ෆ්ගේ village in The jungle නවකතාවේ සිංහල අනුවාදය වූ බැද්දේගම නවකතාව වූ කලී ඒ. පී. ගුණරත්න ලේඛකයා විසින් රචනා කරන ලද්දකි. එහිදී දුප්පත් අහිංසක අසරණ ගැමියාගේ දුක්ඛිත භාවය සහ කූටෝපක්‍රම වලට හසු වී ක්‍රමයෙන් විනාශ වන ඔවුන්ගේ ජීවිත සිලිඳු නම් දඩයක්කරුවා හා ඔහුගේ පවුල ඇසුරෙන් ප්‍රතිනිර්මාණය කිරීමට කතුවරයා සමත් වී ඇත. වරෙක සුන්දරව දිස් වන මහ වනය නිරන්තරයෙන්ම බියකරු බව ම රැඳෙන අමුතුම තැනක් ලෙස එම නව කතාවෙන් හෙළිදරව් කෙරේ.

සිලිඳු මෙම කතා පුවතේ ප්‍රධාන චරිතය යි. ඔහුගේ දියණියන් වූයේ පුංචි මැණිකා සහ හින්නිහාමි ය. බිරිඳ මිය යාමෙන් පසු තම සහෝදරියක් වූ කර්ලිනා හාමි සමග සිය දරුවන් හදාවඩා ගන්නා සිලිඳු තම දරුවන්ට මහත් ආදරයක් සෙනෙහසක් දැක්වූයේ ය. මේ අතර පුංචි මැණිකා ආරච්චිගේ මස්සිනා වූ බබුන් සමග විවාහ වන්නේ ආරච්චිගේ අකමැත්තෙනි. මේ අතර ගමට පැමිණෙන ප්‍රනාන්දු මුදලාලි පුංචිමැණිකා සමග අනියම් සම්බන්ධයක් ඇතිකර ගැනීමට ප්‍රයත්න දරයි. එහෙත් ඔහුගේ ප්‍රයත්නය ඉටුකරගැනීමට නොහැකි වන අතර ඒ හේතුවෙන් ආරච්චි සමග එකතු වී සිලිඳුට හා බබුන්ට විරුද්ධව කටයුතු කරයි. හේන් ගොවිතැන සඳහා බලපත්‍ර අහිමි කරවා බොරු නඩුවකට පැටලීමෙන් බබුන් සය මසකට සිරගත කරවයි. නඩුවෙන් නිදහස් වී පැමිණෙන සිලිඳු ආරච්චි හා ප්‍රනාන්දු මුදලාලිට වෙඩි තබා මරා දමා කෝරළේ වෙත ගොස් භාරවෙයි.

මෙයින් පසු මුළු බැද්දේගම සහ ගම්මුන් ක්‍රම ක්‍රමයෙන් වියැකී ක්ෂය වී යන ආකාරය නවකතාකරු මැනවින් නිරූපණය කරයි. සිලිඳු ජීවිතාන්තය දක්වා සිරගෙට නියම වූ බව ගම පුරා පැතිරී යයි. ආරච්චිගේ මරණයෙන් පසු ඔහුගේ බිරිඳ වූ නැංචොහාමි සිය දරුවන් කැටුව කොටගොඩ ස්වකීය ඥාතීන් වෙත යයි. මෙම සංසිද්ධීන් කතුවරයා සංක්ෂිප්තයන් ආරච්චිගේ නිවස ගරා වැටීම තුළින් නිරූපණය කර ඇත්තේ මෙසේය.

"ආරච්චිගේ ගෙයි වාසය කරන්ට කෙනකු නොවූයෙන් එය කැලයට ඇරිණ. අපල ගෙන දෙන අසුබ නිමිති ඇත්තේ යයි ද අවතාර අඩිකෝඩවලින් පිරුණේ යයි ද ප්‍රසිද්ධ ව ගිය මේ ගෙයි වාසයට ඒමට තරම් සැහැසි වූ කිසිවෙක් ගමේ නො වූහ."

ක්‍රම ක්‍රමයෙන් ගමේ උළු සෙවිලි කළ එකම ගෙය කැලයට යා වූ ආකාරය කතුවරයා මැනවින් පසක් කරයි. ගමේ ප්‍රධානියා ගේ නිවස ගරා වැටීම වූ කලී අන්‍ය ගෙවල් වල ගරා වැටීම සනිටුහන් කරන සංකේතයක් බඳුය. මෙලෙස ආරච්චිගේ නිවස අභාවට යාමත් සමග එය ජනශූන්‍ය වූ ගම්මානයක් බවට පත්වන ආකාරයත් ගමේ පරිහානියත් පියවරෙන් පියවරට කතුවරයා සජීවී ලෙස ඉදිරිපත් කරයි.

"ආරච්චිගේ ගෙය කැලයට යාම කැලය ගම මැදට කඩා පැනීමක් මෙන් වී. මීට පෙර කැලයට හැරුණේ ගමේ ඒ මේ කෙළවරවල තුබුණ ගෙවල් වූ හෙයින් ගම කැලය මැදට රිංගා ඒමක් එයින් වූයේ නැති. වූයේ ටිකින් ටික ගමට හාත්පසින් ගම කුඩා වීම පමණකි."

ආරච්චිගේ නිවස කැලයෙන් වැසී යාමත් සමග සිලිඳුගේ ගෙය අනෙක් ගෙවල් වලින් වෙන් වූ ආකාරය දැනගත් ගම්මු තමන් ජීවත් වන්නේ විනාශ වී යන ගමක බව තේරුම් ගත්තේය. එය නැංචොහාමිගේ සිතැගියක් ලෙස කතුවරයා ගමම අලින්ට ඇරුණු ගමක් ලෙස ධ්වනිත කර ඇත්තේ මෙසේ ය.

"ළමයින් හා මහල්ලන් ද නැසී යන්නාක් මෙන් ගමත් දැන් නැසී යයි. එහි දැන් ළමයි නුපදිත්. අවුරුදු දහයකින් මුළු ගම ම අලින්ට යනවාට කිසි ම සැකයක් නැත' යනු ඇගේ හැඟීම වී ය."

මෙලෙස විසිවන සියවසේ මුල් භාගයේ මෙරට දකුණු පළාතේ ඈත පිටිසර වනගත ගම් පියසක් වූ බැද්දේගම සහ එහි වාසීන් ද ක්‍රමයෙන් අභාවයට පත් වූ ආකාරය සජීවී ලෙස නිරූපණය කරන්නට කතුවරයා සමත් වී ඇත්තේ ය.

Hasitha hettiarachchi
071-9020298

03.සිළිඳුගේ චරිතයත්, පුංචි මැණිකාගේ චරිතයත් බැද්දේගම නවකතාව තුළ නිරූපණය කර ඇති ආකාරය උදාහරණ දෙක බැගින් දෙමින් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

ලෙනාඩ් වුල්ෆ්ගේ village in The jungle නවකතාවේ සිංහල අනුවාදය වූ බැද්දේගම නවකතාව වූ කලී ඒ. පී. ගුණරත්න ලේඛකයා විසින් රචනා කරන ලද්දකි. එහිදී දුප්පත් අහිංසක අසරණ ගැමියාගේ දුක්ඛිත භාවය සහ කුටෝපක්‍රම වලට හසු වී ක්‍රමයෙන් විනාශ වන ඔවුන්ගේ ජීවිත සිලිඳු නම් දඩයක්කරුවා හා ඔහුගේ පවුල ඇසුරෙන් ප්‍රතිනිර්මාණය කිරීමට කතුවරයා සමත්ව වී ඇත. වරෙක සුන්දරව දිස් වන මහ වනය නිරන්තරයෙන්ම බියකරු බව ම රැඳෙන අමුතුම තැනක් ලෙස එම නව කතාවෙන් හෙළිදරව් කෙරේ.

සිලිඳු මෙම කතා පුවතේ ප්‍රධාන චරිතය යි. ඔහුගේ දියණියන් වූයේ පුංචි මැණිකා සහ හින්නිහාමි ය. බිරිඳ මිය යාමෙන් පසු තම සහෝදරියක් වූ කර්ලිනා හාමි සමඟ සිය දරුවන් හදාවඩා ගන්නා සිලිඳු තම දරුවන්ට මහත් ආදරයක් සෙනෙහසක් දැක්වූයේ ය. පුංචි මැණිකාගේ සිතුවිල්ලක් ඔස්සේ සිළිඳුගේ දරු සෙනෙහස නිරූපණය කිරීමට කතුවරයා සමත් වෙන්නේ මෙසේය.

"කුඩා කල සිලිඳු කී වනයෙහි මං මුළා වූ දඩයක්කාරයින්ගේ කතා ඈට සිහි විය. ඔවුන් එදා බියවන්ට ඇත්තේ ද අද තමාට ඇති වී තිබෙන බිය වැනි බියකිනැයි ඈට සිතිණ..."

පරිසරයට ආදරය කළ සිලිඳු ඒ ගැන තම දරුවන්ට කතා කියා දෙයි. කාලයත් සමග සිළිඳුගේ ජීවිතය විනාශ මුඛයට ඇද වැටෙයි. මීට ප්‍රධාන හේතුව බවට පත් වන්නේ ගමට පිටින් පැමිණි ප්‍රනාන්දු මුදලාලි ය. පුංචිමැණිකා දැකීමෙන් ඇය සමඟ අනියම් සබඳතාවක් ඇති කර ගැනීමට ප්‍රනාන්දු මුදලාලි ප්‍රයත්න දරයි. ඒ වන විට ගමේ ආරච්චිගේ මස්සිනා වූ බබුන් සමග විවාහ වී සිටි පුංචි මැණිකා එම අදහස් තරයේම ප්‍රතික්ෂේප කරයි. මෙයින් අමනාප වන ප්‍රනාන්දු මුදලාලි ගමේ ප්‍රධානියා වූ ආරච්චි සමඟ එක් වී සිය අදහස් ඉටුකර ගැනීමට විවිධ කුටෝපක්‍රම යොදයි. බබුන් හා සිළිඳුට සොරකමක් පිළිබඳව බොරු නඩුවක් පටලවා ඔවුන් සයමසක් සිරගෙයට නියම කරවයි. සිලිඳු ඉන් නිදහස් වේ. නිදහස් වූ සිලිඳු ගමට පැමිණි විගස ආරච්චිට සහ ප්‍රනාන්දු මුදලාලිට වෙඩි තබා ඝාතනය කර කෝරළය වෙත ගොස් බාර වෙයි.

"පිස්සු වැද්දා කොටියෙකැ යි කියන්නට පුරුදු වී සිටි ගම්මු පුංචිමැණිකා ගැන කීවේ, කොටියගෙ පැටියා මුවෙක් වෙලා කියා ය."

සිලිඳු රළු, නපුරු මිනිසෙකි. දෙදෙනකු ඝාතනය කරන ඔහු ගම්මුන් කොටියෙක් යැයි හැඳින්වීමෙන් ම ඒ බව පැහැදිලි වේ.

සිය පියා ජීවිතාන්තය දක්වා සිරගෙට නියම වීමත් තම සැමියා නොකළ වරදකට සමසකට සිරගෙයට නියම වීමත් නිසා පුංචිමැණිකා අසරණ වූවා ය. කම්පා වූවා ය. එතැන් සිට තම ස්වාමියා එන තෙක් බලා සිටින පුංචි මැණිකා තුළ වූ ස්වාමි භක්තිය බැද්දේගම නව වන පරිච්ඡේදය පුරාම නිරූපණය වේ.

"ක්‍රමයෙන් මාස ගණනක් ගත වී ගියාට පසු පුංචිමැණිකා දවස පටන් ගන්නට පුරුදු වූයේ අද බබුන් ගෙදර එයි යන බලාපොරොත්තුවෙනි."

පුංචි මැණිකා බබුන් එන තුරු නොඉවසිල්ලෙන් බලා සිටියාය. සමහර අවස්ථාවල ඇය පෙර මඟට ගොස් ආපසු හැරී පැමිණියා ය. සිරගෙට නියම වූ කාල වකවානුව පිළිබඳ නිශ්චිත ලෙස නොදත් ඈ ගම්මුන්ගෙන් ඒ ගැන විමසුවා ය. පුංචිරාළ වෙදරාලගෙන්ද නිසි පිළිතුරක් නොලද ඈ අවසානයේ බබුන් සොයා තංගල්ලේ සිර මැදිරිය වෙත යෑමට තීරණය කරයි. ඇය තුළ වූ ඉවසීමත් අධිෂ්ඨානයත් කෙතෙක් ද යන්න ඉන් මැනවින් ගම්‍ය වේ. සිරගෙදර දී හමුවන හිරපල්ලා බබුන් මිය ගිය පුවත ඇයට කියයි. හිරපල්ලා තම කතාවෙන් ශෝකයට පත්වී කෑගසන ගැහැනියකගේ විලාපයක් බලාපොරොත්තු වුව ද පුංචි මැණිකා තුළ තිබූ වීර්යය නිසා ඇය නිශ්ශබ්දව එතැනින් ඉවතට ගමන් කරන්නේ හිරපල්ලා ද මවිතයට පත් කරමිනි.

"හිරපල්ලා තම කතාවෙන් බලාපොරොත්තු වූයේ හිස අත් බදා ගෙන කෑ ගසන ගැහැනියකගේ විලාපයකි. එහෙත් පුංචිමැණිකා නිශ්ශබ්දව ම එතැනින් ගොස් නැවතත් බිත්තිය අද්දර ඇන තියා ගැනීම ඔහුගේ මවිතයට හේතු විය."

මෙලෙස දරුවන්ට ආදරය කළ පරිසරය සමඟ ජීවත් වූ රළු පුරුෂයෙකු ගේ ලක්ෂණ සිලිඳු තුළින් නිරූපණය කිරීමටත් අහිංසක නමුත් දැඩි ඉවසීමක් ස්වාමි භක්තියක් මෙන්ම නොමඳ අධිෂ්ඨානශීලී බවක් ඇති කාන්තාවකගේ චරිතයක් පුංචි මැණිකා තුළින් නිරූපණය කිරීමටත් කතුවරයා සමත් වී ඇති බව කිව හැකි ය.

Hasitha hettiarachchi
071-9020298

හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

01. "චරිත සංවර්ධනයට නිර්මාණාත්මක අදහස් ඉදිරිපත් කරන ප්‍රතිභාපූර්ණ කවියෙක් 'ජාතික තොටිල්ල' නිර්මාණයේ දී අපට හමු වේ." මේ කියමන සාකච්ඡා කරන්න. (ලකුණු 10)

කොළඹ යුගයේ මුල් පරපුරේ කවියෙකු සේ පිළිගැනෙන ඇස් මහින්ද හිමියෝ සමකාලීන සමාජ වාතාවරණය පාදක කර ගනිමින් කාව්‍යකරණයෙහි නියැලුණහ. අන්‍ය ජාතිකයෙක් වෙනත් ජාතියක අභිමානය උදෙසා වෙහෙස වීමෙන් ඔහු මතු උදාර පුද්ගලයෙකු බවට පත් වේ. ඇස් මහින්ද හිමියන් ද මෙවැනි උදාර පුද්ගලයකු ලෙස සැලකිය හැකිය. "මුනි සිරිපා සිඹිමින්නේ..." යන පදයෙන් ආගමික ආශිර්වාදය ද දරුවාට පිරිනමමින් සමාරම්භ වන "දරු නැළවිල්ල" හෙවත් "ජාතික තොටිල්ල" උන් වහන්සේ විසින් රචිත ජාතික අභිමානය පිළිබඳ හැඟුම් ප්‍රමුදිත වන වීර කාව්‍යයකි. ජාතික තොටිල්ලේ කාව්‍යානුභූතිය වූයේ ළදරුවන් තුළ රට, ජාතිය, ආගම පිළිබඳ ජාතික අභිමානය ඇති කරන යහපත් ආකල්ප සමුදායක් ගොඩ නැංවීමයි.

ඉටු කොට කළ යුතු යුතුකම්
ලැබුණත් ලෝකෙන් ගැරහුම්
ඉවසන්නට පුළුවන් නම්
උඹයි මගේ පුතා උතුම්

දරුවා තුළ අභිමානවත් හැඟුම් උත්පාදනයට සමත් ඔවදන් ගණනාවක් සංයමයෙන් යුක්තව ඉදිරිපත් කිරීමට ඇස් මහින්ද හිමියෝ සමත් වූහ. නිදි දෙව්දුව වැළඳ ගැනීමට සූදානම්ව සිටින දරුවාට සමාජයට කළ යුතුකම් මතක් කර දීමට කවියා ඉදිරිපත් වේ. යුතුකම් ඉටු කිරීමේ දී විවිධ ගැරහුම්, පීඩා ලැබිය හැකි බව කවියා අවධාරණය කරයි. ඒ නින්දා, අපහාස, ගැරහුම් කොතෙක් ලැබුවත් දරුවාගේ සුචරිත වර්ධනයෙහා ලා ප්‍රබල ගුණයක් වන **'ඉවසීම'** නමැති ගුණධර්මය ළමා මනස තුළ පෝෂණය කිරීම ඉතාම වැදගත් බව ප්‍රකාශ කරන කවියා, පුත්‍රයා උතුම් වන්නේ ඉවසීමේ ශක්තිය ඇත්නම් පමණක් බව උක්ත කවියෙන් නිර්මාණාත්මකව ප්‍රකට කරයි.

කාටත් හිමි පොදු දේ නම්
නැති-බැරි, හිඟ අවහිරකම්
මේ දේ මැඩ ගෙන දස්කම්
පෑම තමයි සුරු විරුකම්

රස භාවයන් ළදරු මනස තුළ නිධන්ගත වන ලෙසින් නව්‍ය කාව්‍ය සංකල්පනා උපකල්පනය කරමින් **සුරුවිරුකම්** ඇති කරගත යුතු ආකාරය කවියා මැනවින් විශද කරයි. කවියා විසින් දරුවන්ගේ ආධ්‍යාත්මික මනෝභාවයන් තුළින් නැති - බැරි, අග - හිඟ, අවහිරකම් මැඩ ගත යුතු බවත් ආකම්පය ගුණයෙන් පූර්ණව කටයුතු කළ යුතු බවත් මැනවින් පසක් කරයි. ළමුන්ට මානසික ආතතියෙන් තොරව විශ්වාසනීයත්වයෙන් කටයුතු කිරීමටත්, **'සුරුවිරුකම්'** නිතැතින් අත්පත් කර ගැනීමට හැකියාව ඇති බවත් ව්‍යංගාර්ථවත් ලෙස මවා පා ඇති ආකාරය ප්‍රශස්ත ය.

තම යුතුකම් ඉටු කිරීමේදී ලෝකයේ අවධානයට පාත්‍ර වේ. එවිට ගැරහීම් වලට ලක්වීමෙන් කුඩා දරුවා තුළ ජීවිතය පිළිබඳව, ජයග්‍රහණය පිළිබඳව සෘණාත්මක ආකල්පයක් ඇති විය හැකි ය. එය වළක්වා ගැනීමට කවියා කුඩා දරුවා තුළ ධෛර්ය සම්පන්න සිතුවිලි ඇති කරයි. එය කුඩා දරුවාගේ ආත්ම ශක්තිය වර්ධනය කිරීමකි.

මිතුරුකමින් පෙරට එතොත්
දුවිල්ලක් එක්ක වුණත්
මිතුරු වෙයන් පුතේ උඹත්
එයයි ලොවේ ගුණය මහත්

මිතුරුකමින් පෙරට එනවා නම් දූවිල්ලක් එක්ක වුවත් මිතුරු වීම සාධාරණීකරණය කිරීමෙන් ප්‍රබල සංකේතාර්ථයක් ගම්‍යමාන වෙයි. ළමා චින්තනය මෙහෙයවා සැබෑ මිතුරන් හඳුනා ගත යුතු බවත්, ලොවේ ඉටු මිතුරන් ඇසුරු කිරීම ඵලදායී බවත් මැනවින් පසක් කිරීමට කවියා පෑ ප්‍රතිභාපූර්ණ කවීත්වය විශිෂ්ට ය.

මෙලෙස චරිත සංවර්ධනයට සදාතනික අගයෙන් යුත් ඔවදන් මාලාවක් මාර්ගෝපදේශකයෙකු සේ සදුපදේශාත්මක ධර්මතාවන් මාලාවක් ගැබ් වූ කවි පෙළක් සේ මෙම 'ජාතික තොටිල්ල' පද්‍යාවලිය අගය කළ හැකි ය.

Hasitha hettiarachchi
071-9020298

හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

01.ජාතික තොටිල්ල පද්‍ය පන්තිය සාර්ථක වීමට බලපෑ භාෂා ශෛලිය හා කාව්‍යෝපක්‍රම නිදසුන් සහිතව පහදන්න (ලකුණු 10)

කොළඹ යුගයේ මුල් පරපුරේ කවියෙකු සේ පිළිගැනෙන ඇස් මහින්ද හිමියෝ සමකාලීන සමාජ වාතාවරණය පාදක කර ගනිමින් කාව්‍යකරණයෙහි නියැලුණහ. අන්‍ය ජාතිකයෙක් වෙනත් ජාතියක අභිමානය උදෙසා වෙහෙස වීමෙන් ඔහු මතු උදාර පුද්ගලයෙකු බවට පත් වේ. ඇස් මහින්ද හිමියන් ද මෙවැනි උදාර පුද්ගලයකු ලෙස සැලකිය හැකිය. "මුනි සිරිපා සිඹිමින්නේ..." යන පදයෙන් ආගමික ආශිර්වාදය ද දරුවාට පිරිනමමින් සමාරම්භ වන "දරු නැළවිල්ල" හෙවත් "ජාතික තොටිල්ල" උන් වහන්සේ විසින් රචිත ජාතික අභිමානය පිළිබඳ හැඟුම් ප්‍රමුදිත වන වීර කාව්‍යයකි. ජාතික තොටිල්ලේ කාව්‍යානුභූතිය වූයේ ළදරුවන් තුළ රට, ජාතිය, ආගම පිළිබඳ ජාතික අභිමානය ඇති කරන යහපත් ආකල්ප සමුදායක් ගොඩ නැංවීමයි.

මුනි සිරිපා සිඹිමින්නේ
සමනොළ ගිරි පෙදෙසින්නේ
මඳ සුළඟයි මේ එන්නේ
මගේ පුතා නිදියන්නේ

මවක් තම සිඟිති දරුවා නළවන අයුරු චිත්ත රූප ජනනය වන සේ මාත්‍රා දොළහෙන් යුක්තව මාත්‍රා හයකින් නැවතීම ඇතිවන සේ "වසන්ත විරිත" අනුව රචනා කිරීමට උන් වහන්සේ කටයුතු කර ඇත. පොදුජන වහරේ එන "දොයි දොයි දොයි දොයිය බබා..." යන නැළවිලි පද්‍ය පාදයෙහි අන්තර්ගත වී ඇත්තේ ද වසන්ත විරිතයි. මෙලෙස සාම්ප්‍රදායික රිද්ම රටා උපයුක්ත කර ගනිමින් ජාතික උරුමයක මහිමය මවා පා ඇති අයුරු විශිෂ්ටය. නැණවත් ය. කාව්‍යාත්මක අර්ථ පූර්ණ හැඟුම් ළමා චින්තනය තුළ ජනනය වන සේ ද ආගමික ප්‍රබෝධයක් ඇති වන සේ ද කෙටි විරිතෙන් රචනා කිරීම හරවත් ය.

නිදහස මහ මුහුදක් වේ
එහි උල්පත පුත, නුඹ වේ
ඒ බව සිහි කොට මෙ ලොවේ
යුතුකම ඉටු කළ යුතු වේ

නිදහස අහිමි වූ යුගයක නිදහස මහ මුහුදක් ලෙස කවියා නිරූපණය කරයි. නිදහස නමැති මුහුදේ උල්පත් බවට පත් වන්නේ කුඩා පුතු ය. කවියා ඔහුට යුතුකම් ඉටුකළ යුතු ආකාරය ප්‍රකාශ කරයි. ශ්‍රී පාද ස්පර්ශයෙන් පහස ලත් සමනල අඩවියෙන් එන මන්ද මාරුතයෙන් ප්‍රීතියට පත් වන දරුවා සුව නින්දකට වැටෙන්නේ නිතැතිනි. මෙලෙස රූපකාර්ථ බහුල පද සාධනයෙන් අනූන වූ කාව්‍යාලංකාර නිසා කාව්‍ය සංකල්ප මැනවින් ළමා මනෝ භාවයන් කුළු ගන්වන්නට යොදා ගැනීමට මහින්ද හිමිපාණෝ සමත්වූහ.

කරදර දහසක් හමු වී
ඉන්ටැකි නම් සිනා වෙවී
ඔහු මෙලොවට පහළ දෙවී
රජෙකැයි සලකනු මැනවී

පැදි පෙළ ගැමි ව්‍යවහාරෝචිත වූ වදන් වලින් සරසා ඇති ආකාරය පද්‍යයේ යොදා ඇති "කරදර දහසක්" "ඉන්ටැකි නම් සිනා වෙවී" වැනි වචන වලින් පැහැදිලි වේ. එම සියලු යෙදුම් සරල ය. මටසිළිටි ය. එහෙත් ඉන් ධ්වනිත කෙරෙන හැඟීම් ධාරාවන් අසීමිත ය. පියවරින් පියවර දරුවා යන මාවතේ කටුකොහොල් බොහෝ ය. ඒවා නොතකා සැහැල්ලුවෙන් සිනාසිසී ඉන්නට හැකි නම් ඔහු මෙලොවට පහළ වූ දෙවියෙකි, රජෙකි යන උපදේශය දරුවන්ට මනාව වැටහෙයි.

මෙලෙස එළිසමය එළිවැට සුරකිමින් වසන්ත වසන්ත විරිතෙන් රචිත "ජාතික තොටිල්ල" හෙවත් "දරුනැලවිල්ල" ගැමි ව්‍යවහාරෝචිත යෙදුම්, රූපක, සරල වදන් ආදී කාව්‍යෝපක්‍රම හා භාෂා ශෛලිය නිසා ම අතිශය සාර්ථක නිර්මාණයක් බවට පත් කරන්නට කවියා සමත් වී ඇත්තේ ය.

Hasitha hettiarachchi
071-9020298

03.දේශාභිමානි හැඟීම් ළමා සිත් තුළ ජනිත කරවීමට උචිත ලෙස බස හැසිරවීමෙහි ලා කවියා සතු දක්ෂතාව ජාතික තොටිල්ල පැදි පෙළ තුළින් මනාව ඉස්මතු වේ. නිර්දිෂ්ට කොටසින් උදාහරණ තුනක්වත් දක්වමින් විමසන්න. (ලකුණු 10)

කොළඹ යුගයේ මුල් පරපුරේ කවියෙකු සේ පිළිගැනෙන ඇස් මහින්ද හිමියෝ සමකාලීන සමාජ වාතාවරණය පාදක කර ගනිමින් කාව්‍යකරණයෙහි නියැලුණහ. අන්‍ය ජාතිකයෙක් වෙනත් ජාතියක අභිමානය උදෙසා වෙහෙස වීමෙන් ඔහු මතු උදාර පුද්ගලයෙකු බවට පත් වේ. ඇස් මහින්ද හිමියන් ද මෙවැනි උදාර පුද්ගලයකු ලෙස සැලකිය හැකිය. "මුනි සිරිපා සිඹිමින්නේ..." යන පදයෙන් ආගමික ආශිර්වාදය ද දරුවාට පිරිනමමින් සමාරම්භ වන "දරු නැළවිල්ල" හෙවත් "ජාතික තොටිල්ල" උන් වහන්සේ විසින් රචිත ජාතික අභිමානය පිළිබඳ හැඟුම් ප්‍රමුදිත වන වීර කාව්‍යයකි. ජාතික තොටිල්ලේ කාව්‍යානුභූතිය වූයේ ළදරුවන් තුළ රට, ජාතිය, ආගම පිළිබඳ ජාතික අභිමානය ඇති කරන යහපත් ආකල්ප සමුදායක් ගොඩ නැංවීමයි.

නිදහස මහ මුහුදක් වේ
එහි උල්පත පුත, නුඹ වේ
ඒ බව සිහි කොට මෙ ලොවේ
යුතුකම ඉටු කළ යුතු වේ

සිරිපා සිඹ එන මද සුළඟ දරුවා සිපගත් සැනින්, නින්දට ඇරයුම් කරන දරුවාට, මව නිදහස ගැන සිහිපත් කර දෙන්නේ මෙසේය. එය ලාංකේය ජනතාවට අවශ්‍ය ජාතික නිදහස බව නිසැකය. නිදහස් අහිමි වූ යුගයක නිදහස මහ මුහුදක් ලෙස කවියා ප්‍රකාශ කරයි. මෙහි නිදහස නමැති මුහුදේ උල්පත බවට පත් වන්නේ කුඩා පුතුය. එපුතුට යුතුකම් ඉටුකළ යුතු ආකාරය කවියා මෙලෙස ඉදිරිපත් කරමින් ළමා මනෝ භාවයන් කුළු ගන්වන්නට මහින්ද හිමිපාණෝ සමත්වූහ.

තමන් ලැබූ දිවි පෙවෙතේ
කොටසක් රට සමය වෙතේ
පුද නොකළොත් උඹෙන් පුතේ
මෙලොවට කිසි පලක් නැතේ

පුද්ගලයකු ලෙස ඉපදී පුද්ගලයකු ලෙස මිය යාම නිතර ම සිදුවන්නකි. මනුෂ්‍ය ජීවිතයේ වටිනාකම ඇත්තේ ඉන් කොටසක් රට ජාතිය වෙනුවෙන් වැය කිරීමෙනි. එසේ නොකළහොත් ලෝකයට කිසිඳු ඵල ප්‍රයෝජනයක් නොමැති බව කවියා අවධානයට ලක්කරයි. ඉපදී මියයන ජීවිත කාලය තුළ පුද්ගලයකු උදාර වන්නේ තම ජීවිතයේ යුතුකම් ඉටුකිරීමට ජීවිතයෙන් කොටසක් රට ජාතිය වෙනුවෙන් පුද කිරීමෙනි. ළදරුවාට කුඩා කලදීම තම යුතුකම් ඉටුකරමින් ගත කළ යුතු ජීවිතය පිළිබඳව කථකයා අවධානයට ලක්කරයි.

ඉටු කොට කළ යුතු යුතුකම්
ලැබුණත් ලෝකෙන් ගැරහුම්
ඉවසන්නට පුළුවන් නම්
උඹයි මගේ පුතා උතුම්

තම යුතුකම් ඉටු කිරීමේදී ලෝකයේ අවධානයට පාත්‍ර වේ. එවිට ගැරහීම් වලට ලක්වීමෙන් කුඩා දරුවා තුළ ජීවිතය පිළිබඳව, ජයග්‍රහණය පිළිබඳව සෘණාත්මක ආකල්පයක් ඇති විය හැකි ය. එය වළක්වා ගැනීමට කවියා කුඩා දරුවා තුළ ධෛර්ය සම්පන්න සිතුවිලි ඇති කරයි. එය කුඩා දරුවාගේ ආත්ම ශක්තිය වර්ධනය කිරීමකි.

මෙලෙස මුනිසිරිපා කාව්‍ය තුළින් ස්වකීය දේශය හා ආගම කෙරෙහි අප්‍රමාණ ස්වදේශානුරාගයක් හා දේශාභිමානයක් ළමා චින්තනය තුල ජනිත කරන්නට කවියා සමත් වී ඇත්තේ ය.

Hasitha hettiarachchi
071-9020298

01. අත්දැකීම රසවත්ව ඉදිරිපත් කිරීමට කවියා භාෂාව යොදා ගෙන ඇති ආකාරය සාකච්ඡා කරන්න. පැහැදිලි කරන්න.

(ලකුණු 10)

කොළඹ යුගයේ දෙවන කවි පරපුර නියෝජනය කළ කුඩලිගම කවියා සොභා සොඳුරු වැනුම් වස්තු විෂය කර ගනිමින් කාව්‍යකරණයේ නියුතු වූයේය. ඔහු විසින් රචිත "ඈ" පද්‍ය සංග්‍රහයේ එන "ගංගාවේ සංගීතය" ස්වභාව සෞන්දර්යය තේමා කර ගනිමින් එය මිනිස් ජීවිතයට බද්ධ කරමින් ස්වකීය පරිකල්පනාවෙන් යුක්තව අපූර්ව පද සංකල්පනාවන් ඔස්සේ ගළපමින් සහෘදයාට තිළිණ කරන්නට කුඩලිගමයන් ක්‍රියා කර ඇති ආකාරය අපූරුය. කඳු බෑවුමක සිට වෑහෙන ගංගාවක් රිදී වන් දිය දහරාවකින් රන්වැලිතලා පොඟවාගෙන ඉදිරියට ඇදෙයි. එසේ ගලා යන ගංගාව නම් කාන්තාව සිය ස්වාමියා වූ මුහුද නමැති හිමියාට ඇය සතු සියලු බර ප්‍රදානය කරන බවක් කවියා පවසයි.

කඳු බෑවුමක දං - බෝවිටි පඳුරු තලා
පහළට ඇදී පර මල් පෙති ඉවත නොලා
කලදෝ දියෙන් පොඟවා රන් පුලින තලා
සංගීතවත් වී යමි ඉදිරියට ගලා

උක්ත පද්‍ය පාදවල එන "පර මල් පෙති", "කලදෝ දියෙන්", "රන් පුලින තලා" යන රූපකාර්ථවත් පද සංයෝජනයෙන් "සංගීත්වත් වී යමි" යන සංකේතාර්ථවත් වූ වාචාර්ථය අබිබවා යන පද්‍ය මාලාව නිසා සොබා සිරියේ අසිරිය සහෘදයාට දැහැන් ගත කිරීමට කුඩලිගමයෝ සමත් වූවා සේ ය. අජීවී වස්තුවක් වන ගංගාවට ජීවය ආරෝපණය කරමින් නවතම කාව්‍ය සංකල්පනාවක් ප්‍රකට කිරීමට භාෂාව යොදා ගැනීමට මෙහිදී කතුවරයා සමත් වී ඇත. කුඩලිගමයන්ගේ කවි බස පෝෂණය කළ උචිත ම සංකේතයක් ලෙස ද මෙය හැඳින්විය හැකි ය. එයින් ධ්වනිතාර්ථවත් සංකල්ප රූප මැවෙන නිසා මෙම පද්‍යාවලියේ අගය වැඩි වේ. එය නැවුම් ය. රස ජනනයට ද එය ඉවහල් වෙයි. මේ නිසා කුඩලිගම කවියාගේ කවි බස රසපූර්ණ, අර්ථපූර්ණ, භාවපූර්ණ හා ධ්වනි පූර්ණ ගුණයෙන් සුපෝෂිත ය.

හිරිමල් සිනා රැළි පෙණ පිඬු මිහිරි තම
ගල් පරවල ම හැපි හැපි බිහි කරමි මම
සම තැනිතලාවල හමු වෙයි අලස කම
නිරසයි අතරමඟ අවහිර නුදුටු බිම

කුඩලිගම කවියා පද්‍ය කරණයේ දී යොදාගත් බස ඉතාම සරල ය. නිරවුල් ය. "හිරිමල් සිනා රැලි" රූපකාර්ථ හැඟුම් කුළුගන්වන වදන් වැලකි. "බිහි කරමි මම" මෙය ව්‍යාකරණය නොඉක්මවූ බස් වහරකි. "හැපි හැපී" යනු අනුප්‍රාසවත් බස් වහරකි. මෙවැනි පොදු ජන ව්‍යවහාරෝචිත බස් වහරට සමීප පබැඳුම් නිසා ම කුඩලිගමයන්ගේ කවි තුළින් අති විශාල පාඨක පිරිසක් සුපෝෂණයට පත්ව ඇතැයි විචාරකයෝ පිළිගනිති.

මී අඹ - කිරල - මාදම් ගෙඩි ළඳරුවියේ
ඇකයෙහි හෙළා හඬවයි සැඩ සුළඟ රැයේ
සුළි මැද කැරැකෙමින් ඉඳුනිල් ගැඹුරු දියේ
සමහර තැනක ලස්සන මල් කැකුළු තියේ

කාව්‍යයක අගය රැදී ඇත්තේ ඒවායේ වාචාර්ථයේ ම නොවේ. වාචාර්ථය අභිබවා මතුවන ධ්වනිතාර්ථ මගින් කාව්‍යයෙහි අගය උද්දීප්ත වෙයි. යථෝක්ත පද්‍යයේ "මී අඹ, කිරල, මාදම් ගෙඩි ළඳරුවියේ" යන්නෙන් නොපැසුණු ගෙඩි වර්ග සැඩ සුළඟ නැමැති රැයේ ඇකයේ හෙළා හඬවන බව කවියා ප්‍රකට කරයි. "සමහර තැනක ලස්සන මල් කැකුළු තියේ" යන අවසාන පද්‍ය පාදයෙන් සරල අදහසක් මතු කරයි. කවියකු භාෂාව භාවිතා කළ යුත්තේ ධ්වනිතාර්ථවත්, ව්‍යංගාර්ථවත් ලෙස භාෂාව භාවිතයෙන් කාව්‍ය සංකල්පනා මතුකර ගත හැකි ආකාරයෙනි.

මෙලෙස කොළඹ යුගයේ දෙවන යුගයේ කවීන් විසින් අරඹන ලද කාව්‍ය විප්ලවයේ නියමුවෙකු වූ කුඩලිගම කවියා, තම අත්දැකීම් රසවත්ව ප්‍රකාශනය කිරීමට රූපකාර්ථවත් සංකේතාර්ථවත් මෙන්ම ධ්වනිතාර්ථවත් භාෂාවක් උපයුක්ත කර ගනිමින් පද්‍යකරණයේ නියැළී ඇති බව හෙළි වෙයි.

Hasitha hettiarachchi
071-9020298

02. රස නිෂ්පත්තිය සඳහා කවියා භාවිත කරන විවිධ කාව්‍යෝපක්‍රම විස්තර කරන්න. (ලකුණු 10)

කොළඹ යුගයේ දෙවන කවි පරපුර නියෝජනය කළ කුඩලිගම කවියා සොභා සොඳුරු වැනුම් වස්තු විෂය කර ගනිමින් කාව්‍යකරණයේ නියුතු වූයේය. ඔහු විසින් රචිත "ඈ" පද්‍ය සංග්‍රහයේ එන "ගංගාවේ සංගීතය" ස්වභාව සෞන්දර්යය තේමා කර ගනිමින් එය මිනිස් ජීවිතයට බද්ධ කරමින් ස්වකීය පරිකල්පනාවෙන් යුක්තව අපූර්ව පද සංකල්පනාවන් ඔස්සේ ගළපමින් සහෘදයාට තිළිණ කරන්නට කුඩලිගමයන් ක්‍රියා කර ඇති ආකාරය අපූරුය.

කඳු බෑවුමක දං - බෝවිටි පඳුරු ත ළා
පහළට ඇදී පර මල් පෙති ඉවත නො ළා
කලදෝ දියෙන් පොඟවා රන් පුලින ත ලා
සංගීතවත් වී යම් ඉදිරියට ග ලා

උක්ත පද්‍ය පාදවල එන "පර මල් පෙති", "කලදෝ දියෙන්", "රන් පුලින තලා" යන රූපකාර්ථවත් පද සංයෝජනයෙන් "සංගීත්වත් වී යම්" යන සංකේතාර්ථවත් වූ වාචාර්ථය අබිබවා යන පද්‍ය මාලාව නිසා සොබා සිරියේ අසිරිය සහෘදයාට දැහැන් ගත කිරීමට කුඩලිගමයෝ සමත් වූවා සේ ය. එයින් ධ්වනිතාර්ථවත් සංකල්ප රූප මැවෙන නිසා මෙම පද්‍යාවලියේ අගය වැඩි වේ. එය නැවුම් ය. රස ජනනයට ද එය ඉවහල් වෙයි. මේ නිසා කුඩලිගම කවියාගේ කවි බස රසපූර්ණ, අර්ථපූර්ණ, භාවපූර්ණ හා ධ්වනි පූර්ණ ගුණයෙන් සුපෝෂිත ය.

රිදී වන් දිය දහරාවන්ගෙන් රන් පුලිනතලා පොඟවමින් පහළට ඇදී යන ගංගාව නවතම සංකල්ප රූප ජනනය කරවයි. ගංගාවේ දෝංකාරය රසිකයාට හැඟේ. දැනේ. තම නිර්මාණයේදී සරල සිවුපද ආකෘතිය යොදා ගන්නා රචකයා සරල බස් වහරක් උපයෝගී කරගනිමින් සිය අව්‍යාජ හැඟීම් ඉදිරිපත් කර ඇති ආකාරය අපූරු ය.

සැඟවෙමි - එබෙමි - නිසසල වෙමි - සසල වෙ මි
ඇඹරෙමි - එහෙත් පසු නොබසිමි - නොනවතිමි
කවදා කොතැනක දි හෝ මහ මුහුදු හි මි
හමු වුණු කෙණෙහි මා සතු බර ඔහුට දෙ මි

පූර්වෝක්ත පද්‍යයේ සැඟවෙමි, එබෙමි, නිසසල වෙමි, සසල වෙමි, යන වදන්වැල අනුප්‍රාසවත් සරල බස් වහරකි. දීර්ඝ ගමනක් නොනවත්වා පැමිණි ගංගාව නමැති කාන්තාව තමා සතු බර තම ස්වාමියා ලෙස සලකන මහ මුහුද වෙත පිරිනැමීම කවියා ඉදිරිපත් කර ඇති ආකාරය අපූරුය. මහ මුහුද ස්වාමියා ලෙස ඉදිරිපත් කිරීම අර්ථ පූර්ණ සරල වහරකි. මෙලෙස අතිශය ගැඹුරු දහමක් සරල බසකින් ධ්වනිත කර ඇති ආකාරය ප්‍රශස්ත ය.

මී අඹ - කිරල - මාදම් ගෙඩි ළදරු වි යේ
ඇකයෙහි හෙළා හඬවයි සැඩ සුළඟ රැ යේ
සුළි මැද කැරැකෙමින් ඉදුනිල් ගැඹුරු දි යේ
සමහර තැනක ලස්සන මල් කැකුළු ති යේ

කාව්‍යයක අගය රැඳී ඇත්තේ ඒවායේ වාචාර්ථයේ ම නොවේ. වාචාර්ථය අභිබවා මතුවන ධ්වනිතාර්ථ මගින් කාව්‍යයෙහි අගය උද්දීප්ත වෙයි. යථෝක්ත පද්‍යයේ "මී අඹ, කිරල, මාදම් ගෙඩි ළදරුවියේ" යන්නෙන් නොපැසුණු ගෙඩි වර්ග සැඩ සුළඟ නැමැති රැයේ ඇකයේ හෙළා හඬවන බව කවියා ප්‍රකට කරයි. "සමහර තැනක ලස්සන මල් කැකුළු තියේ" යන අවසාන පද්‍ය පාදයෙන් සරල අදහසක් මතු කරයි. කවියකු භාෂාව භාවිතා කළ යුත්තේ ධ්වනිතාර්ථවත්, ව්‍යංගාර්ථවත් ලෙස භාෂාව භාවිතයෙන් කාව්‍ය සංකල්පනා මතුකර ගත හැකි ආකාරයෙනි. ඔහු තම නිර්මාණය තුළ එළිසමය, එළිවැට ආරක්ෂා කර ඇති ආකාරය ද දැකගත හැකි ය.

මෙලෙස කොළඹ යුගයේ දෙවන යුගයේ කවීන් විසින් අරඹන ලද කාව්‍ය විප්ලවයේ නියමුවෙකු වූ කුඩලිගම කවියා, තම කාව්‍යාවලියේ රස නිෂ්පත්තිය සඳහා රූපක. සංකේත, ධ්වනිතාර්ථවත් බස, සරල බස, එළිසමය, එළිවැට, අනුප්‍රාසය වැනි කාව්‍යෝපක්‍රම උපයුක්ත කර ගනිමින් පද්‍යකරණයේ නියැළී ඇති බව මනාව හෙළි වෙයි.

Hasitha hettiarachchi
071-9020298

03. ගංගාවේ සංගීතය පද්‍ය නිර්මාණයෙන් කවියා ඉදිරිපත් කරන ජීවන දර්ශනය පැහැදිලි කරන්න. (ලකුණු 10)

කොළඹ යුගයේ දෙවන කවි පරපුර නියෝජනය කළ කුඩලිගම කවියා සොබා සොඳුරු වැනුම් වස්තු විෂය කර ගනිමින් කාව්‍යකරණයේ නියුතු වූයේය. ඔහු විසින් රචිත "ඈ" පද්‍ය සංග්‍රහයේ එන "ගංගාවේ සංගීතය" ස්වභාව සෞන්දර්යය තේමා කර ගනිමින් එය මිනිස් ජීවිතයට බද්ධ කරමින් ස්වකීය පරිකල්පනාවෙන් යුක්තව අපූර්ව පද සංකල්පනාවන් ඔස්සේ ගළපමින් සහෘදයාට තිළිණ කරන්නට කුඩලිගමයන් ක්‍රියා කර ඇති ආකාරය අපූරුය. කඳු බෑවුමක සිට වෑහෙන ගංගාවක් රිදී වන් දිය දහරාවකින් රන්වැලිතලා පොඟවාගෙන ඉදිරියට ඇදෙයි. එසේ ගලා යන ගංගාව නම් කාන්තාව සිය ස්වාමියා වූ මුහුද නමැති හිමියාට ඇය සතු සියලු බර ප්‍රදානය කරන බවක් කවියා පවසයි.

හිරිමල් සිනා රැළි පෙණ පිඬු　　　මිහිරි ත ම
ගල් පරවල ම හැපි හැපි බිහි　　　කරමි ම ම
සම තැනිතලාවල හමු වෙයි　　　අලස ක ම
නිරසයි අතරමග අවහිර නුදුටු　　　බි ම

ගංගාවක් මුලාරම්භයේ සිට ගමනාන්තය දක්වා සිදුවන ආගමනය සැබෑ මිනිස් දිවියට සමාන කරමින් කුඩලිගම කවියා සිය කාව්‍ය සංකල්පනා ඔස්සේ ගැඹුරු අරුතක් මවාපායි. ගංගාවද මුලාරම්භයේදීම ගල් පර වල ගැටෙයි. හිරිමල් සිනා රැළි නංවයි. මිහිරි වූ පෙණ පිඬු නංවයි. යෞවන වියේ ගඟේ ස්වභාවය කියාපාන කවියා පරිණත වියට එළඹෙන්නේ සමබිමක් හමුවන අවස්ථාවේදීය. එවිට ගංගාව උදාසීනව සෙමින් සෙමින් ගලා බසියි. ගංගාවේ ස්වභාවයට අනුකූලව මිනිස් දිවියේ ද සැබෑ යථාර්ථය මෙන්ම ගැඹුරු සනාතන ධර්මයක් නිරූපණය කිරීමට කුඩලිගම කවියා සමත් වේ. ගංගාවක් පරිණත අවධියේ යම් සේ අලස වේද මිනිස් දිවිය ද පරිණත වියට එළැඹෙත්ම නිතැතින් අලස බවට පත්වීම නොවැළැක්විය හැකිය. අවහිර බාධක කම්කටොලු නොදුටු කළ ගලා යන ගඟ සේම මිනිස් දිවිය ද නීරස වන බව මැනවින් විද්‍යාමාන කිරීමට කවියා සමත් වේ. එය කවියාගේ ජීවන දර්ශනයේ එක් පැතිකඩක් සේය.

එන්නේ කොහි සිට ද - කොතැනකට ද　　　ය න් නේ
ඔබ කුමකට ද මා දුටු තැන　　　විමසන් නේ
මිනිසුන් ගිහින් නිතර ම ආපසු　　　එ න් නේ
කිම දැ යි කියා කිසිවකු ඇයි?　　　නොසොයන් නේ

කවියා ගංගා, කඳු බෑවුම්, අහස - පොළොව ආදිය ගැන කතා කළ ද මිනිස් ජීවිතය පිළිබඳ ගැඹුරු දර්ශනයක් පණිවිඩයක් දීමට ගත් උත්සාහය උක්ත පද්‍යයෙන් හෙළිවෙයි. ගංගාව කොහි සිට කොහි යන්නේදැයි නොදනී. එලෙසම මිනිස් දිවිය ද අනපේක්ෂිත ලෙස ඉපදෙයි. මිය යයි. සොබාදහම සමග සසඳමින් කවියා මේ සර්වකාලීන අගයකින් යුතු ගැඹුරු ධර්මතාවය සරල බසකින් කියා පායි. ගඟෙහි මුලාම්භයේ සිට ගමනාන්තය දක්වා යන ගමන, ජීවිත ගමන නැතහොත් සංසාර ගමනට සම්බන්ධ කර සිය ජීවන දර්ශනය බෞද්ධ ආගමික ආභාසයෙන් ගොඩනගා ගත් සිතුවිලි දාමයක් ඔස්සේ නිරූපණය කිරීමට කවියා සමත් වූවා සේ ය.

රන් තරු පිරිවරා ගත් සඳ මඬල　　　ය ට
මහ වන බිමක් මැද ගිරි කුළු අතර　　　සි ට
නොමියන හේලි දහමක පණිවුඩය　　　පි ට
කොඳුරමි කෙඳිරියක් මුළු ලොව නිසල　　　කො ට

කොළඹ යුගයේ දෙවන පරපුර නියෝජනය කළ බොහෝ කවීන් සොබාදහමේ තිබූ දේ ජීවිතයට ඒකාබද්ධ කිරීමට උත්සාහ දරයි. ස්වභාව සෞන්දර්යයේ අපූරු දේ ඇසුරින් අමන්දානන්දයට පත් කවීන් සරල සුගම බස් වහරින්, සෞන්දර්ය හා ජීවිතය ඒකාත්මික කරමින් මනුෂ්‍ය ජීවිතය, සොබාදහම පිළිබඳ අපූර්ව අත්දැකීම් මවා පායි. රන් තරු පිරිවරාගත් චන්ද්‍රමඬල යට සිටිමින් මහ වන බිමක් මැද ගිරිකුළු අතර වෙසෙන අමරණීය වූ සනාතන දහම පිළිබඳ පණිවිඩයක් දී සිහින් කෙඳිරිලි හඬක් පා ලොවම නිසල කළ ආකාරය කවියා ගම්‍යමාන කර ඇත.

මෙලෙස කොළඹ යුගයේ දෙවන යුගයේ කවීන් විසින් අරඹන ලද කාව්‍ය විප්ලවයේ නියමුවෙකු වූ කුඩලිගම කවියා, පොදු මිනිසුන් සඳහා කාව්‍යකරණයෙහි යෙදෙමින් සරල වූත් ගැඹුරු වූත් ජීවන දර්ශනයක් මතු කර ඇති ආකාරය හෙළි වෙයි.

Hasitha hettiarachchi
071-9020298

01.“දරුවන්ගේ සුබ සිද්ධිය තකා ක්‍රියා කරන මවකගේ චරිතය සුප්පා දේවියගෙන් සංකේතවත් වෙයි.” පාඩම ඇසුරෙන් නිදසුන් සහිතව විමසන්න. (ලකුණු 10)

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් රචිත සිංහබාහු නාටකය ශෛලිගත සම්ප්‍රදායෙන් නිෂ්පාදිත නාට්‍යාවලියේ අග්‍රඵලය ලෙස බොහෝ විචාරකයන් විසින් සලකනු ලබයි. පැරණි බස් වහර සහ ගද්‍ය බස් වහර ද සංකලනයෙන් යොදා ගත් මා හැඟි ගීතාවලියකින් පරිපූර්ණ වූ සංගීතමය නාටකයක් වන එය ‘සුප්පා දේවිය, සිංහයා සහ සිංහබාහු’ යන චරිත ත්‍රිත්වය වටා ගොඩ නැගී ඇති අපූරු නාට්‍යයක් ලෙස අගය කළ හැකිය.

නාට්‍යයේ එන චරිත අතරින් සුප්පා දේවියගේ චරිතය දාරක ප්‍රේමයෙන් සුපෝෂිත වූ මව් සෙනෙහසේ ප්‍රතිමූර්තියක් සේ ප්‍රතිනිර්මාණය කිරීමට නාට්‍ය රචකයා සමත් වී ඇත්තේ ය. සිංහයා සමඟ විවාහයෙන් ලැබූ දරුවන් සමඟ ඇය ඔවුන් වැඩිවියට පත්වන තුරු රැකබලා ගනිමින් ගේහසික ප්‍රේමයෙන් යුක්තව ගිරි ලෙනක විසුවද දරුවන් ක්‍රමයෙන් වැඩි වියට පත් ව වියුක්ත චින්තන අවධිය ට අවතීර්ණ වෙයි. කුඩා කල ඔවුන් අසන පැනයන් සුළු වුව ද නුවණින් මුහුකුරා යත්ම පරිසරයෙන් උකහා ගත් දැනුම් ඇතිව ඇයගෙන් අසන පැනයන් ද බොහෝ වෙයි. විවිධ වෙයි. සුප්පාදේවියට දරු දෙදෙනාට ඔවුන් අසන පැනයන්ට නිසි පිළිතුරු ලබාදීමට සිදු වේ.

“ඔබ පියාණෝ නරයෙකු නො ව වනයෙහි දී මට හමු වූ සිංහ රාජයෙකි. ඔහු කෙරෙහි ඇති වූ ප්‍රේමය නිසා මම රාජ සැප හැර දමා මේ වනයෙහි වෙසෙමි, දරුවෙනි. ...”

සුප්පා දේවිය සිය අතීතාවර්ජනය කරමින් දරුවන් ඉදිරියේ ප්‍රකාශිත නිර්ව්‍යාජ වූ පරම සත්‍ය පූර්වෝක්ත පාඨයෙන් ධ්වනිත වෙයි. මෙය කන හෙත්ම සිංහබාහුගේ චින්තනය විකසිත වෙයි. ලෙන් උරුමය හැරදා මනු උරුමය සොයා යාමට ඔහු තීරණය කරයි. සුප්පා දේවියට බොහෝ දුර දිග බලා කල්පනා කර තීරණයකට එළඹීමේ මානසික ආතතියට පත්වූ අවස්ථාවක් ලෙස මෙම මොහොත රචකයා විසින් විවරණය කරනු ලැබෙයි. සිංහයා කිසි විටෙකත් වන වාසය හැරයාමට එකඟ නොවන බව ඇය හොඳාකාරවම දනී. සැමියා කෙරේ මෙන්ම දෙදරුවන් කෙරේ ද ඈ සතු වගකීම ඉමහත්ය. අසීමිතය.

“යන්නට වේ දැන් සැමියා හැරා - වන වාසෙන් මේ පුතු සමගා
දරුවන් දෙදෙනා - හට සෙත් ලැබෙනා. ...”

ජීවිත පරිඥානයෙන් පරිපූර්ණ වූ සුප්පා දේවිය සිය සැමියා හැර දමා දෙදරුවන් සමගින් යන්නට තීරණය කරයි. සැමියා වෙත පෑ අසීමිත ස්වාමි භක්තියත්, දෙදෙනා අතර පැවැති අඹු - සැමි සබඳතා දෙදරා යන මොහොත උදා වී ඇති ආකාරයත් නාට්‍ය රචකයා මැනැවින් පසක් කරයි. සුප්පාදේවිය තුළ ඇතිවන මානසික ඝට්ටනයේ උච්චතම අවස්ථාවක් ප්‍රේක්ෂකයා ඉදිරියේ නාට්‍යකරුවා මවා පායි. කෙසේ වුවත් අවසානයේ තම දෙදරුවන්ගේ යහපත උන්නතිය උදෙසා ඔවුන්ට ඇති අසීමිත සෙනෙහස පෙරදැරි කරගෙන ලෙන අතහැර යන්නට ඇය තීරණය කරයි. දාරක ප්‍රේමයෙන් හදවත පිරී ඉතිරී යයි. තම හද පත්ලෙන් නැගුණු සෝසුසුම් මැද ඇය අවසන් තීරණයකට එළැඹුණා ය. මෙයින් මවකගේ දාරක ප්‍රේමය කතුවරයා මැනවින් ධ්වනිත කරයි.

“දෙවියන් බාරයි මා සමිඳා - මා වෙත නොවනු ය කෝපා
දරුවන් සන්දා - කරනෙමි මෙබන්දා. ...”

මෙලෙස අවිනිශ්චිත දෙගිඩියාවෙන් පෙළෙන ඇයගේ චරිතය, දරු සෙනහසින් මුසපත් වූ චරිතයක් ලෙසත් දරුවන්ගේ සුභ සිද්ධිය තකා කටයුතු කරන මවක් ලෙසත් ප්‍රකට කිරීමට නාට්‍යකරුවා සමත් වෙයි. හුදෙකලා වන සැමියාට සුවෙන් වෙසෙන්නට ‘දෙවියන්ට බාරයි මා සමිඳා’ යැයි ඇය පතන්නී ය. තමා මෙවන් පියවරක් ගන්නේ දරුවන්ගේ සුබ සිද්ධිය සඳහා නිසා ‘මා වෙත නොවනු කෝපා’ යනුවෙන් ඇය අයදියි. එහෙත් ඇය දුකින් තැවි තැවී දෙදරුවන් ගේ සුබසිද්ධිය තකා ගන්නා ලද උදාර පියවර සිය දරුවන්ගේ යහපත උදෙසා බව මැනවින් ධ්වනිත වෙයි.

Hasitha hettiarachchi
071-9020298

02. "භාෂා භාවිතයේ දී සරච්චන්ද්‍රයන් දක්වා ඇති දක්ෂතාව, දී ඇති නාට්‍ය කොටස ඇසුරෙන් විස්තර කරන්න." (ලකුණු 10)

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් රචිත සිංහබාහු නාටකය ශෛලිගත සම්ප්‍රදායෙන් නිෂ්පාදිත නාට්‍යාවලියේ අග්‍රඵලය ලෙස බොහෝ විචාරකයන් විසින් සලකනු ලබයි. පැරණි බස් වහර සහ ගද්‍ය බස් වහර ද සංකලනයෙන් යොදා ගත් මා හැඟි ගීතාවලියකින් පරිපූර්ණ වූ සංගීතමය නාටකයක් වන එය 'සුප්පා දේවිය, සිංහයා සහ සිංහබාහු' යන චරිත ත්‍රිත්වය වටා ගොඩ නැගී ඇති අපූරු නාට්‍යයක් ලෙස අගය කළ හැකිය.

මෙම නාට්‍යයේ ගද්‍ය සංවාද පවා පැරණි බස් වහර සහ ජන කවියේ බස් වහරද සංකලනයෙන් අර්ථපූර්ණ, භාවපූර්ණ, ධ්වනිපූර්ණ බස්වහරක් යොදාගෙන නිර්මාණයය කර ඇති නිසා ප්‍රේක්ෂකයා තුළ රසෝද්පාදනයට එහි බස් වහර සමත් වී ඇත. තවද සංගීතය සහ කාව්‍ය යන කලාවන් දෙකෙහිම සුසංයෝජනය නිසා භාවගීතමය ගුණයෙන් පෝෂිත බස්වහරක් ලෙස ද මෙහි බස් වහර අගය කළ හැකිය. මෙහි ලෙන අතහැර යාම කොටසේ එන නාට්‍යෝචිත අවස්ථා නිරූපණයේදී රසික චින්තනය තුළ චමත්කාරයෙන් උද්දීපනය කිරීමට භාෂාව යොදාගෙන ඇති ආකාරය ප්‍රශස්ත ය.

"කිම් ද මෑණියනි ඔබ මේ - පවසන වදනා
ඇස් කන් ඇදහිය නොහේ ය - ඇසෙන මෙ අරුමා ..."

ගල්ලෙන තුළ සිර වී කොටු වී හුදෙකලාව දවස ගෙවන සුප්පාදේවිය විසින් තම දරුවන් සනසාලන අටියෙන් ඉපැරණි රාජ කතා ආදිය පවසනු ලබයි. අතීතාවර්ජනය කරයි. එවන් අවස්ථාවල කතුවරයා ඇගේ මුවට නංවන භාෂණය නිසා දරුවන් තුළ නැණ පහන් දැල්වෙයි. හැඟුම්බර කාව්‍යෝක්ති යොදා ගැනීමෙන් ඥාන මණ්ඩලය මෙන්ම භාව මණ්ඩලය ද ප්‍රමුදිත වෙයි. විකසිත වෙයි. මෑණියන්ගේ කතා අසා විස්මයට පත්වන සිංහබාහු තුළ ඇතිවන ප්‍රතික්‍රියාව උක්ත නිදසුනේ ආකාරයට සිංහබාහු ගේ මුවට නංවා ඇත්තේ අපූරු ආකාරයෙනි. මෙම කාව්‍යෝක්තිය නාට්‍ය අවස්ථාව හා අවියෝජනීය ලෙසින් බැඳී ඇති නිසා රසිකයා තුළ නිසැකයෙන්ම චමත්කාරය ජනනය වෙයි.

"මෑණියනි කීව ඔබ බස් අසා - සනිටුහන් කර ගතිමි
නොපමා ව යා යුතු ය - මේ ලෙනෙන් ඔබ දෙදෙන
මා සමග යා යුතු ය ..."

තාරුණ්‍යයේ රුවන් දොරටුව අබියසට එළඹ සිටි සිංහබාහු වහාම ලෙන් උරුමය හැර දමා යන්නට සිතයි. මනු උරුමය සොයා යාමට අදිටන් කළ පුත්‍රයා තමා සමග වහාම එන ලෙස තම මවට සහ නැගණියට අවධාරණය කර ඇති ආකාරය දැක්වෙන සිංහබාහුගේ මුවින් ප්‍රකාශ මෙම ගීත ඛණ්ඩය අතිශයින් හරවත් ය. අර්ථපූර්ණ, භාවපූර්ණ, ධ්වනිපූර්ණ වන සේ නිරූපිත මෙම බස්වහර අතිශයින්ම සාර්ථක ය. තාරුණ්‍යයෙහි ගති ලක්ෂණයන්ට ඔබින උදාරත්වය සහ නිබය බව ප්‍රකට වන මෙම යෙදුම උචිත කාව්‍යෝක්තියක් ලෙස ද අගය කළ හැකිය. මෙවැනි අර්ථාන්විත අවස්ථා උද්දීපනය කළ හැක්කේ නාට්‍ය අවස්ථාව හා කාව්‍යෝක්තිය අවියෝජනීය ලෙස බැඳී තිබීමෙන් පමණි. අනතුරුව එළැඹෙන උද්වේගකර නාට්‍යෝචිත අවස්ථාව උද්දීපනය කර ඇති ආකාරයෙන් කතුවරයා සිය බස හැසිරවීමේ පෘශක්‍යතාව මැනවින් ප්‍රකට කරවයි.

"දෙවියන් බාරයි මා සමිඳා - මා වෙත නොවනු ය කෝපා
දරුවන් සන්දා - කරනෙමි මෙබන්දා. ..."

ඇය අවසන් තීරණයකට එළැඹෙයි. මේ වියෝව ඇයට දරාගත නොහැකි ය. ඒ නිසා 'දෙවියන්ට බාරයි මා සමිඳා' යනුවෙන් රසිකයා තුළ හද සසල වන සේ භාව කම්පනයක් ඇතිවන ගීතාත්මක ධ්වනිපූර්ණ වදන් සමුදායක් කතුවරයා ඇයගේ මුවට නංවයි.

මෙලෙස භාෂා භාවිතයේදී සහෘදයා තුළ චමත්කාරජනක මනෝභාවයන් විකසිත වන සේ අර්ථ පූර්ණ, ධ්වනිපූර්ණ, කාව්‍යෝචිත ගීතාත්මක බස් වහරක් උපයෝගී කරගනිමින් රචිත සිංහබාහු නාටකය ප්‍රතිභාසම්පන්න නිර්මාණයක් ලෙස අතිශයින්ම සාර්ථක ය.

Hasitha hettiarachchi
071-9020298

03.“සිංහබාහුගේ චරිතයෙන් තරුණයකුගේ අදහස් හා ක්‍රියාකාරිත්වය මනාව පිළිබිඹු වේ” පාඩම ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් රචිත සිංහබාහු නාටකය ශෛලිගත සම්ප්‍රදායෙන් නිෂ්පාදිත නාට්‍යාවලියේ අග්‍රඵලය ලෙස බොහෝ විචාරකයන් විසින් සලකනු ලබයි. පැරණි බස් වහර සහ ගද්‍ය බස් වහර ද සංකලනයෙන් යොදා ගත් මා හැඟි ගීතාවලියකින් පරිපූර්ණ වූ සංගීතමය නාටකයක් වන එය ‘සුප්පා දේවිය, සිංහයා සහ සිංහබාහු’ යන චරිත ත්‍රිත්වය වටා ගොඩ නැගී ඇති අපූරු නාට්‍යයක් ලෙස අගය කළ හැකිය.

මෙහි එන සුප්පා දේවිය සිංහයා සමඟ විවාහයෙන් ලැබූ දරුවන් සමඟ ඔවුන් වැඩිවියට පත්වන තුරු රැකබලා ගනිමින් ගේහසික ප්‍රේමයෙන් යුක්තව ගිරි ලෙනක විසුවද දරුවන් ක්‍රමයෙන් වැඩි වියට පත් ව වියුක්ත චින්තන අවධිය ට අවතීර්ණ වෙයි. කුඩා කල ඔවුන් අසන පැනයන් සුළු වෙයි. එහෙත් නුවණින් මුහුකුරා යත්ම පරිසරයෙන් උකහා ගත් දැනුම් ඇතිව සිංහබාහු පියාගේ හැඩරුව පිළිබඳ සිය මවගෙන් කුතුහලයෙන් යුතුව විමසා බලයි. එනයින් සිය පියාගේ වෙනස දැනගත් සිංහබාහු වික්ෂිප්ත වෙයි. පුදුමයට පත් වූ තරුණයකුගේ සිතැඟියාවන් ත්‍රීව්‍ර වන සේ සිංහබාහුගේ මුවට නංවන ගීත ඛණ්ඩයෙන් එය මනාව ධ්වනිත වෙයි. .

“කිම් ද මෑණියනි ඔබ මේ - පවසන වදනා
ඇස් කන් ඇදහිය නොහේ ය - ඇසෙන මෙ අරුමා ...”

සුප්පා දේවිය සිය අතීතාවර්ජනය කරමින් පරම සත්‍ය පවසයි. මෙය කන හෙත්ම සිංහබාහුගේ චින්තනය විකසිත වෙයි. ලෙන් උරුමය හැරදා මනු උරුමය සොයා යාමට ඔහු තීරණය කරයි. තාරුණ්‍යයට නව පණක්, නව ප්‍රබෝධයක්, ලබන ඔහු වහ වහා ක්‍රියාකාරී වෙයි. සිය යුතුකම් මතකයට නැංවෙයි. මව් උරුමයේ අසිරිය විඳින්නට තමා පමණක් නොව තම නැගණියන් ද මව ද කැටුව යාමට ඔහු උත්සුක වෙයි. මේ සැබෑ තාරුණ්‍යයේ ක්‍රියාකාරීත්වය යි. සිංහබාහු සිය නිදහස පතා වංග දේශයට තනිව යාමට තරම් අකෘතඥ නොවේ. තම සෙනෙහෙබර මවත් නැගණියත් තනිකර ලෙන අතහැර කෙසේවත් ඔහුට ඉදිරියට යා නොහැකි ය.

“යන්ට දැන් නම් කාලෙ වේ -මෑණියන් හා නැගණි සමගින්
උරුමෙ අපගේ සොයමිනා
වංග දේසේ වෙසෙන ජනතා - කෙරෙහි වේ මා යුතුකමා. ...”

එහෙත් මෙතෙක් කාලයක් වාසය කළ ලෙන අතහැර දා යාම සුළුපටු කර්තව්‍යයක් නොවේ. සිය පියාගෙන් ඒ සඳහා විටෙකත් අනුමැතිය හිමි නොවේ. තාරුණ්‍යයේ බාධක කම්කටොළු එමට ය. නැගණිය පවසන්නේ ලෙන් දොර හැර ගත නොහැකි බවයි. එහෙත් එයින් අධෛර්යයට පත් නොවන සිංහබාහු පවසන මේ ගී ඛණ්ඩයෙන් ඔහුගේ පෞරුෂයත්, අධිෂ්ඨානශීලී ක්‍රියා පිළිවෙතත් මැනවින් ධ්වනිත වෙයි.

“තුමුල ගතින් දා - බාහු බෙලෙන් දා
වෙම් සේ තිදසින් දා
කුරිරු ගිජින්දා - කුඹු තල සින්දා
ලම් සේ කෙසරින්දා
මා පිය මිගිඳා කරනා විකුමන්
ඇයි මට බැරි වන්නේ...”

සිංහබාහුගේ නිර්භීත භාවයත් උදාර භාවයත් මෙකී ගී කණ්ඩයෙන් මැනවින් පසක් වෙයි. මෙලෙස ක්‍රියාකාරී තරුණයෙකුගේ සහජ හැකියාවන්, ලැදියාවන්, සිංහබාහුගේ චරිතය ඇසුරෙන් මැනවින් ප්‍රකට කිරීමට සරච්චන්ද්‍රයෝ සමත් වූහ.

Hasitha hettiarachchi
071-9020298

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු සිංහල ගණිතය සහ විද්‍යාව විෂය වලට අයත් මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා මෙම නිබන්ධනය යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

ස්තූතියි !

සැකසුම

හසිත හෙට්ටිආරච්චි

(Dip. In Sci. N.I.E./O.U.S.L.)

3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1